VIDUS 14-1-1

**හැඳින්වීම**

විදුරාව සඟරාවේ මෙම කලාපයෙහි අඩංගු කරුණු රැගෙන ඇත්තේ ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය විසින් සංවිධානය කර, 1990 පෙබරවාරි මාසයේදී පැවැත්වුණු "ජාන සම්පත් සංරක්ෂණය හා සංවර්ධනය – ප්‍රශ්න හා විකල්ප" යන මැයින් පැවැත්වුණු සම්මන්ත්‍රණයට සහභාගි වූවන් විසින් ඉදිරිපත් කරන ලද ලිපි ඇසුරෙනි.

මෙම සම්මන්ත්‍රණය ඉදිරියේ කියවන ලද ලිපිවල මාතෘකා සහ ඒවා ඉදිරිපත් කළ අය මෙසේය :

1. **ජාන සම්පත් සංරක්ෂණය – පුළුල් දෘෂ්ටි කෝණයෙන් :**
   **එල්. සී. ඒ. ද එස්. විජේසිංහ**
   අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
   ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය

2. **ජාන සංරක්ෂණය, කෘෂිකර්මය හා ආහාර අතින් ආරක්ෂාව :**
   **එස්. ඩී. ජී. ජයවර්ධන**
   ප්‍රධාන නිලධාරී,
   ශාක ජාන සම්පත් මධ්‍යස්ථානය,
   ගන්නොරුව.

   **එස්. බාලේන්දිර.**
   ජාන බැංකු කළමනාකාර,
   ශාක ජාන සම්පත් මධ්‍යස්ථානය,
   ගන්නොරුව.

3. **සංරක්ෂණ කළමනාකරණ උපක්‍රම – බාහිර ස්ථානගත සංරක්ෂණය :**
   **ඩී. බී. සුමිත්‍රාරච්චි.**
   නියෝජ්‍ය අධ්‍යක්ෂ, කෘෂිකර්ම (උද්භිද උද්‍යාන)
   රාජකීය උද්භිද උද්‍යානය,
   පේරාදෙණිය.

4. **ශ්‍රී ලංකාවේ වනාන්තර ජාන සම්පත් සංරක්ෂණ උපක්‍රම :**
   **එච්. එම්. බණ්ඩාරතිලක**
   නියෝජ්‍ය අධ්‍යක්ෂ, වන සංරක්ෂණ (පරිසර කළමනාකරණය)
   වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
   රජමල්වත්ත පාර,
   බත්තරමුල්ල.

5. **ශ්‍රී ලංකාවේ දේශීය සත්ව සම්පත :**
   **එස්. ඩබ්. කොටගම**
   අධ්‍යක්ෂ,
   වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුව

6. **ශ්‍රී ලංකාවේ ජාන සංරක්ෂණයට අදාළ නීතිමය කරුණු :**
   **සීමාසහිත පරිසර පදනම**
   6, බොයිඩ් පෙදෙස,
   කොළඹ 03. (දේශනය පැවැත්වූවේ : රවි අල්ගම)

7. **ජාන සම්පත් සංරක්ෂණය හා අඛණ්ඩ සංවර්ධනය – ප්‍රශ්න හා විකල්ප :**
   **කේ. පී. හාරතී**
   අතිරේක අධ්‍යක්ෂ, වන සංරක්ෂණ (කළමනාකරණ),
   වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

VIDUS 14-1-2

## ජාන – ඒවායේ වැදගත්කම

මහ පොළොව අනුපමේය ග්‍රහ ලෝකයකි. අප එසේ පවසනුයේ මුළුමහත් විශ්වයෙහි වෙනත් කිසි තැනකින් මේ දක්වා සොයා ගත නුහුණු අමිල වස්තුවකට එය නිජබිම වන නිසාය. මේ මහාර්ඝ වස්තුව නම් අන් කිසිවක් නොවේ, ඉතා නොදියුණු පැලෑටියේ පටන් ඉතාමත් සංවර්ධිත, ඉතාමත් සංකීර්ණ, මිනිසා දක්වා වූ සියලු ජීවීන් තුළ ගැබ්ව ඇති – "ජීවය" නමැති ලක්ෂණයයි.

ජීවය ද අතිශයින් විස්මයජනක සංසිද්ධියකි. උපත, වර්ධනය, ප්‍රජනනය, පරිහානිය සහ මරණය යන සම්පූර්ණ ක්‍රියාවලිය ඊට ඇතුළත් වෙයි. සියලුම ජීවීහු කවරදා හෝ මිය යති. එහෙත් ඔවුහු ප්‍රජනන ක්‍රියාවලිය මාර්ගයෙන් සිය වර්ගයාගේ අමරණීයත්වය තහවුරු කර ගනිති. සත්ත්ව සහ ශාක යන දෙගණයටම අයත් දෙමව්පියෝ පොදුවේ තමන්ට සමාන ලක්ෂණ සහිත දරුවන් ඇති කරති. එහෙත් ඒ දරුවන් (නොහොත් "පුද්ගලයන්") වෙන් වෙන්ව ගෙන සලකා බැලූ විට, ඉතා සියුම් ලක්ෂණ නිසා හැම එකෙකුම අන් එකෙකුගෙන් වෙනස් වන බව පෙනේ. තම තමන්ට මුහුණ දීමට සිදුවන අභියෝගයන්ට – පරිසර තත්ත්වයන්ට මුහුණ දිය හැකි පරිදි හැඩ ගැසෙමින්, සිය වර්ගයා දිගින් දිගටම පවත්වා ගැනීමට ඔවුන්ට ආධාර වන්නේ ඉහත සඳහන් සියුම් "පුද්ගලික වෙනස්කම්" මාලාවයි.

දෙමව්පියන්ගේ ලක්ෂණ දරුවන්ට හිමිවනුයේ "ජාන" මගිනි. කිසියම් ජීවයක සුවිශේෂ ලක්ෂණ හැඩ ගස්වන -- නිර්ණය කරන -- ජීව රසායනික අණු කණ්ඩායමක් අපි ජාන නමින් හඳුන්වමු. වර්ණ දේහ (ක්‍රෝමොසෝම්) නම් ලත් එක්තරා ව්‍යුහයන් රාශියක දික් අතට, ජාන එල්ලී පවතී. එක් වර්ණ දේහයක ජාන සිය ගණනක් ඇත. ඒ ඒ ජානය ජීවියාගේ කිසියම් ලක්ෂණයක් හැඩ ගස්වයි.

ජීව ලෝකය තුළ අප දකින අපරිමිත විවිධාකාර ජීව ස්වරූපයන් උද්ගතව තිබෙනුයේ මෙකී ජානවල බලපෑම නිසාය. ජීවීන් අතර දක්නට ලැබෙන මේ වෙනස්කම් අනුව, ඒවා විවිධ අන්දමින් බෙද දක්වන්නට අපට පුළුවන. පළමුවෙන්ම අපි ඒවා ශාක සහ සත්ත්ව යනුවෙන් දෙකොටසකට බෙදමු. ඉක්බිති, කුලය, පවුල, විශේෂය හා (විශේෂයට අයත්) එක් එක් ජීවය (ශාකය හෝ සත්ත්වයා) වශයෙන් අනුක්‍රමයෙන් කුඩා කණ්ඩායම්වලට වර්ග කරමු. කිසියම් ශාක හෝ සත්ව විශේෂයකට අයත් මුළු ශාක හෝ සත්ව සමූහය එහි "ප්‍රජාව" ලෙසින් හැඳින්වේ.

මේ අනුව, එක් ප්‍රජාවකට අයත් වන සත්ව හෝ ශාක සමූහය තුළ ජාන දහස් ගණනක් විසිරී පැතිර පවතිනු විය හැකිය. මෙකී ජාන සමස්තය එම විශේෂයට අදළ ජාන "සම්භාරය" වෙයි. විශේෂය තුළ පවත්නා ජානමය විවිධත්වය එයින් නියෝජනය කෙරේ.

සරල නිදසුනක් ඇසුරෙන් අපට මෙය පහසුවෙන් වටහා ගත හැක. බල්ලන් දෙස බලමු. විශේෂයක් ලෙස ගත් කල, අන් සත්ව විශේෂවලින් (ඌරන්, එළුවන් ආදී සත්ව විශේෂවලින්) ඔවුන් වෙන් කරගත හැකි පොදු ලක්ෂණ සෑම බල්ලකු කෙරෙහිම විද්‍යමාන වෙයි. එහෙත්, ඒ අතර – විශේෂ, සියුම්, වෙනස්කම් නිසා එක් බල්ලෙක් තවෙකෙකුට වඩා වෙනස් වෙයි. මෙය බලු සංහතියට අදල ජාන සම්භාරය ක්‍රියාත්මක වීම නිසා පැන නැගී ඇති ප්‍රතිඵලයකි. එබැවින්, එකිනෙක ජීවියාට අදල වෙනස්කම් ජනිත කරවීමේ ශක්තිය ඇත්තා වූ කිසියම් ජීව විශේෂයක් සංරක්ෂණය කර ගැනීමට නම්, ඒ හා සම්බන්ධ ජාන සම්භාරය ආරක්ෂා කර ගත යුතු බව පැහැදිලිය. අනෙක් අතට, අදල ජාන සම්භාරය නොරැකේ නම් ඒ හා සම්බන්ධිත ජීව විශේෂය ද අනුක්‍රමයෙන් වඳ වී යන බව පැහැදිලි වෙයි.

### ජීව විශේෂයන් සංරක්ෂණය කල යුත්තේ ඇයි?

සියලු ජීව විශේෂයන් සංරක්ෂණය කර ගැනීමේ අවශ්‍යතාව හුවා දක්වන හේතු ගණනාවක් වෙයි. එහෙත්, "මිනිසා විසින් ජීව විශේෂ සියල්ලම සංරක්ෂණය කළ යුත්තේ ඔහුගේම යහපත පිණිසය" යන්න සංරක්ෂණයට පක්ෂව ඉදිරිපත් කළ හැකි ප්‍රබලතම තර්කය වේ. නිදසුන් කීපයක් ගෙන බලමු. ශාක විශේෂ දහස් ගණනක් ඇතත්, මිනිසා විසින් ප්‍රයෝජනයට ගෙන ඇත්තේ ඉන් සිය ගණනක් පමණි. මෙතෙක් දවස් නොසලකා හැර තිබූ ශාකවලින් ගත හැකි විවිධ ප්‍රයෝජන දිනපතා සොයා ගනු ලැබේ. දැනට අප බහුල ලෙස භාවිතා කරන ඖෂධ ශාකවලින් ලබා

ගත් ඒවා බව අපි දනිමු. මෙම අංශයෙහිදී කෙරෙන නව සොයා ගැනීම් ගැන නොකඩවා අසන්නට ලැබේ.

ආහාර පාන, ඖෂධ හෝ කාර්මික අමුද්‍රව්‍ය වශයෙන් පමණක් නොව, තවත් විවිධ අන්දමින් ද ප්‍රයෝජනයට ගත හැකි අගනා, ජානමය ලක්ෂණ දැනට අප "වල් පැළෑටි" නමින් හඳුන්වන ශාකවල ගැප්ව පවතියි. තවමත් මැනවින් අධ්‍යයන කර නොමැති ශාක විශේෂ මහා රාශිය ගැන සලකන කල, ප්‍රයෝජනයට ගත හැකි ඉඩකඩ අසීමිත බව අපට පැහැදිලි වේ.

ශාක හා සත්ව විශේෂ වඳවී යාම නිසා පරිසරයට එල්ල විය හැකි තර්ජන ගැන විස්තර අනවශ්‍යය.

## සංරක්ෂණ උද්යෝගය

ලොව පුරා ස්වාභාවික වනාන්තර විනාශ වී යන වේගය නිසා ජාන සංරක්ෂණයේ අවශ්‍යතාව ගැන දැන් දැන් කද උනන්දුවක් පවතී. මෙහිදී නිවර්තන කලාපීය තෙත් වනාන්තර ආරක්ෂාව ප්‍රමුඛත්වය උසුලයි. මීට ප්‍රධාන හේතු දෙකක් ඇත. ස්වාභාවික පරිසරය සුරැකීම අරබයා එම වනාන්තරවලින් ඉටුවන මෙහෙය එහි ප්‍රථම හේතුවයි. ලොව අන් කවර පෙදෙසකවත් දක්නට නොලැබෙන අපූර්ව ශාක හා සත්ව විශේෂයන්ට එම වනාන්තර නිජ භූමියවීම දෙවැනි හේතුවයි.

සිංහරාජ, හෝටන් තැන්න ආදී විස්මයජනක ස්වාභාවික දයාද නිසා ශ්‍රී ලංකාව ද ලෝකයේ පරිසරකාමීන්ගේ හා ආරක්ෂකයන්ගේ අවධානයට යොමු වී තිබේ. අප සතු මේ අනුපමේය, මහාර්ඝ ස්වභාවික සම්පත දෙස අප බැලිය යුත්තේ හුදෙක් අප සඳහා පමණක් නොව, තවමත් ලොව නූපන් අනාගත ලෝක මානව පරපුරට ද ප්‍රයෝජනවත් වන සේ මැනවින් රැකගත යුතු මහා ධන සම්භාරයක් ලෙසය.

## යථාර්ථය

සංරක්ෂණය පැසසිය යුතු අරමුණකි. එහෙත්, එය ක්‍රියාත්මක කිරීමේදී, මිනිසාගේ සමාජ – ආර්ථික සංවර්ධන අවශ්‍යතා සහ සොබා දහමේ අවශ්‍යතාව අතර ගැටුම් පැන නගින අවස්ථා විරල නොවේ.

එබඳු වූ ගැටුම් නිරාකරණය සඳහා කිසියම් නොවරදින "සූත්‍රයක්" ඉදිරිපත් කිරීමට අපි අසමත් වෙමු. එහෙත්, එකක් නම් කිව හැකි. මිනිසා සහ සොබා දහමේ සාමකාමී සහජීවනය තහවුරු කරනු උදෙසා ඒ හා සම්බන්ධිත විවිධ අංග පිළිබඳව සියුම් අධ්‍යයන රැසක් අප විසින් කළ යුතුව ඇත.

## ජාන සංරක්ෂණය හා අපේ ආහාර නිෂ්පාදනය

### ප්‍රශ්නය

ගත වූ දශක කිහිපය මුළුල්ලේම සහලින් ස්වයංපෝෂිත වීමට, අන් ආහාර බෝග නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට, ශ්‍රී ලංකාව ඉමහත් ප්‍රයත්නයක් දරා ඇත්තේය. අලුතින් ඉඩම් අස්වැද්දීම, වාරිමාර්ග පහසුකම් සැලසීම, ගොවිතැන් කටයුතු සඳහා (සම්ප්‍රදායික පිලිවෙල අතහැර) යන්ත්‍රෝපකරණ භාවිතා කිරීම, උසස් අස්වැන්න සහිත නව මාදිලියේ බෝග ජාති හඳුන්වා දීම, කෘතිම පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය – මේ එකී අරමුණු අත්පත් කර ගැනීම සඳහා උපයෝගී කරගත් ප්‍රධාන උපක්‍රම සමහරකි.

ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනයෙහි සැලකිය යුතු තරම් ප්‍රගතියක් දක්නට ලැබුණ ද යට සඳහන් උපක්‍රම කිසිවෙකින් ආහාර අතින් ජාතියට ආරක්ෂා සහිත තත්ත්වයක් ලබා ගැනීමට කිසිසේත් සමත් වී නැත. අනෙක් අතට, මැතදී පොහොර සහනාධාරය ඉවත් කරනු ලැබුවායින් පසු, ආහාර නිෂ්පාදනය අනුක්‍රමයෙන් පරිහානියට පත්වන බවක් පෙනෙන්නට ඇත. එබැවින්, ප්‍රතිඵලදායක උපක්‍රම සකස් කර ගැනීමේ අරමුණ ඇතිව, වර්තමාන තත්ත්වයට තුඩුදුන් හේතු සාධක විමර්ශනය කිරීම ප්‍රයෝජනවත් වේ.

### විග්‍රහය

ස්වභාවික පරිසර පද්ධතිවලට මුහුණ පෑමට සිදුවන අඩමාන තත්ත්වයන්ගෙන් ඒවා වැළකී සිටින්නේත් අවිනිශ්චිත තත්ත්වයන්ට මුහුණ දෙන්නේත් ජීව විද්‍යාත්මක විවිධත්වය අනුසාරයෙනි.

මිනිස් අතින් සැකසුණු කෘෂි – පරිසර පද්ධතිවල වගා කෙරෙන බෝග සතුව ඇති ජානමය විවිධත්වය ඉතා පටු බැවින් වෙනස් වන පරිසරීය බලවේගවලට සාර්ථක ලෙස මුහුණ දීමට ඒවා අසමත් වේ.

කෘෂිකර්මය සඳහා අවශ්‍ය වන ඉඩම් වැනි සම්පත් උපයෝගීතාවෙහි උපරිම මට්ටමට දැන් අපි එළඹ සිටිමු. එබැවින්, මේ දක්වා අනුගමනය කළ උපාය මාර්ග අනුසාරයෙන් ආහාර නිෂ්පාදනය වැඩි කර ගැනීමට තවදුරටත් අපට නුපුළුවන.

## විසඳුම

ආහාරමය අංශයෙන් ජාතියේ සුරක්ෂිත බව තහවුරු කිරීමේ උපාය මාර්ගය සෙවිය යුත්තේ පරිසරය සුරැකීම මගින් බව ඉහත සඳහන් කරුණුවලින් පෙනී යනු ඇත.

ස්වභාවික පරිසර පද්ධතිවල සුරක්ෂිත බව තහවුරු වනුයේ ජීව විද්‍යාත්මක විවිධත්වය ඇසුරෙනි. එබැවින්, කිසියම් කෘෂිකාර්මික පද්ධතියක් දිගින් දිගටම පවත්වා ගැනීමට නම්, එය විසින් කළ යුතුයේ හැකිතාක් දුරට ස්වභාවික පද්ධති අනුකරණය කිරීමයි – යන තීරණයට එළඹීම ද තර්කානුකූල වේ. ස්වභාවික පරිසර පද්ධතිවල පැවැත්ම තහවුරු කරවීමට සාධක වන ප්‍රධාන ලක්ෂණය වනුයේ ඒවා තුළ පවත්නා ජානමය විවිධත්වය බව අපි දුටුවෙමු. මෙම ගුණාංගය වූ කලී මිනිස් අතින් නිර්මිත පද්ධති තුළ හීන වී යන්නක් වෙයි. දෙමුහුන් කිරීම හා ජානමය ප්‍රතිසම්බන්ධතා අනුසාරයෙන් එබඳු පද්ධතිවල ජානමය විවිධත්වය වැඩි යතත්, ජාන ක්ෂය වීම, ජාන දුබලත්වය හා ජාන වඳවීම වැනි ලක්ෂණ නිසා ජනිත වනුයේ ඊට පටහැනි නැමියාවකි. ස්වභාවික පද්ධති සමඟ සසඳන විට, මිනිසා විසින් නිර්මිත පද්ධති තුළ අන්තර්ගත දෙවැනි ගණයේ ලක්ෂණ නිසා පළමුවැනි ගණයේ ලක්ෂණවලට වඩා ප්‍රබල, අනර්ථකාරී බලපෑම් උද්ගත වන බව පෙනී යයි.

මේ අනුව, දීර්ඝකාලීන වශයෙන් පවත්වා ගත හැකි ගොවිතැන් ක්‍රමයක් ගොඩ නගා ගත හැක්කේ ප්‍රධාන වශයෙන්ම, වගා බෝගවල ජානමය විවිධත්වය තහවුරු කිරීමෙන් බව පැහැදිලිය.

අවම භූමි ප්‍රමාණයකින් හා බලශක්ති යෙදවුමකින් උපරිම අස්වැන්නක් ලබා දීමට සමත් ජාන ප්ලාස්ම තිබීම මත එකී අරමුණ අත්පත් කර ගැනීමේ හැකියාව රඳා පවතී. ඒ අතරම, ජාන ප්ලාස්ම භාවිතයේ ලා, පරිසරීය වශයෙන් උචිත උපක්‍රම සකස් කර ගැනීම ද අවශ්‍ය වෙයි.

## තහවුරුව

උසස් මට්ටමේ අස්වනු ලබා ගැනීමේ අරමුණෙන් මඩනා ලද ශාක බෝ කරන්නන් විසින් තෝරාගත් බෝගය පුන පුනා භාවිතා කිරීම නිසා එවැනි බෝගවල ජානමය පදනම පටු වී ගොස්, ඒවා අතුවරවලට පාත්‍රවීමේ ඉඩකඩ ද විශාල වේ.

ඒ නිසා, ජානමය විවිධත්වය සුරකිනු වස්, විවිධ මාදිලියේ ජානදර්ශ නිරතුරු මාරු කළ යුතුය.

විශාල වශයෙන් වගා කෙරෙන එකම මාදිලියේ සුවිශේෂ බෝග ආක්‍රමණය කරන පළිබෝධකයින්ගේ පැතිරීම ද මෙයින් වැළකී යනු ඇත.

මෙම පිළිවෙත ක්‍රියාත්මක කරනු සඳහා ජාන සංචිතයක් වුවමනා කෙරේ. මෙකී සංචිතය සතු හිතකර ලක්ෂණ ඒකාකාර ජාන දර්ශවලට "කාවැද්දීමෙන්" මනා ප්‍රතිඵල ලබා ගත හැකිය. මේ සඳහා අවශ්‍ය තාක්ෂණය දැනටමත් වගා දිගා කර ගෙන ඇත්තේය.

විවිධ මාදිලියේ ශාක හා විවිධාකාර ශාක විශේෂ වගා කිරීම කුඩා ගෙවුයන් වතු වගාවේ දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි. මෙබඳු උපක්‍රම ද ජානමය විවිධත්වය රැකීමට ඉවහල් වේ.

මෙවැනි ක්‍රම සහ විධි අනුගමනය කිරීමෙන් විශාල පෙදෙසක් පුරා දිගු කලක් මුළුල්ලේ ජානමය විවිධත්වය නොනසා රැක ගන්නට පුළුවන. එමගින් වගා බෝගවල අස්වැන්නෙහි ද සැලකිය යුතු වැඩිදියුණුවක් අත්පත් කරගත හැක.

VIDUS 14-1-5

# අම්ල දයාදයකට රුකරවණ සලසනු වස්....
# ශ්‍රී ලංකාවේ වනාන්තර ශාක
# ජාන සම්පත් සුරුකුම

**සැබෑ සම්පත නම්..........**

ලොව පවත්නා ඉතාමත් පොහොසත්, ඉතාමත් සංකීර්ණ, ඉතාමත් විවිධ පරිසර පද්ධති අතරින් සමකාසන්න වනාන්තර ප්‍රමුඛ ස්ථානය උසුලයි. ඒවා සැලකිය යුත්තේ අසීමිත අන්දමින් ප්‍රයෝජනයට ගැනීමේ ඉඩකඩ සහිත විස්මයජනක ජාන සම්භාරයක් දරා සිටින මහා ධන නිධානයක් ලෙසිනි. මේ අනුව, ශ්‍රී ලංකාවේ වන සම්පත අප සතු මහාමාර්ඝතම ස්වාභාවික දායාදය ලෙස කල්පනා කළයුතු වෙයි. ශ්‍රී ලංකාවේ තිබෙන මල් දරන ශාක විශේෂ 3360 අතරින් 24%ක් තරම් අප රටේ පමණක් දක්නට ලැබෙන ඒවා බව මෙනෙහි කළවිට අපේ වනාන්තරවල අම්ල බව ගැන කිසියම් දැනුමක් අපට ලැබේ. ඒ අනුව, වග විභාගයක් නොමැතිව වනාන්තර එළිපෙහෙළි කර දැමීම නිසා ජාන විවිධත්වයට හානි පැමිණීම හේතු කොට ගෙන අගනා ශාක විශේෂ අභාවයට යාමෙන් ශ්‍රී ලංකාව තුළ බිහිසුණු පරිසරය ප්‍රශ්න උද්ගත විය හැකි බව ඉතා පැහැදිලිය.

**තර්ජනය**

අවාසනාවකට මෙන්, ගත වූ දශක කිහිපය තුළදී අපේ වනාන්තර තදින් විනාශ වී යාමේ තර්ජනයට මුහුණ දී ඇත. 1956–1985 අතරතුර කාලයේදී ශ්‍රී ලංකාවේ හෙක්ටයාර මිලියන 1.5 ක වනාන්තර විනාශ වී ඇත. අවුරුදු පතා මෙසේ විනාශවන වනාන්තර ප්‍රමාණය සාමාන්‍යයෙන් හෙක්ටයාර 12,000 කැයි ගණන් බලා තිබේ.

ජනගහණයේ සීඝ්‍ර වර්ධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ගොවිතැන්, ගම් පුළුල් කිරීම්, සංවර්ධන කටයුතු, අපනයන බෝග වගා ආදිය සඳහා අලුත් ඉඩම් වැඩි වැඩියෙන් අවශ්‍ය වීම මෙසේ වනාන්තර එළිපෙහෙළි වීමට ප්‍රධාන හේතුව වේ.

මහවැලි ව්‍යාපෘතිය නිමාවට පත්වීමේ සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රයත්නවල ප්‍රතිඵලයක් වශයෙන්, වනාන්තර එළි කිරීමේ වේගය බොහෝදුරට අඩු වී ඇතත්, ජනගහනය වැඩිවන තාක්, අලුත් ඉඩම්වලට ඇති ඉල්ලුමේ පහත වැටීමක් බලාපොරොත්තු වීමට අපට නුපුළුවන.

**අවශ්‍යතාව**

ඉහත දැක්වුණු තත්ත්වය යටතේ ශ්‍රී ලංකාව තුළ වන ප්‍රදේශ ප්‍රමාණවත් තරමින් පවත්වා ගනිමින් දිගින් දිගටම ප්‍රයෝජන ගත හැකි වන පරිදි ඒවා පරිපාලනය කිරීම වැදගත් අවශ්‍යතාවක් බව පැහැදිලි වේ. මේ අනුව, පහත සඳහන් අරමුණු මුල් කර ගනිමින් ශ්‍රී ලංකා වන සංරක්ෂණ ප්‍රතිපත්තිය සම්පාදනය කොට ඇත්තේය :

1 පරිසරය, පස හා ජල සම්පත් වැඩි දියුණු කිරීම සහ ආරක්ෂා කිරීම, සෞන්දර්යාත්මක, විද්‍යාත්මක, ඓතිහාසික හා සමාජ ආර්ථික හේතු අනුව, අවශ්‍ය පරිදි දේශීය සත්ව හා ශාක ආරක්ෂා කිරීම.

2. කෘෂිකාර්මික අවශ්‍යතාව සපුරාලීමට සහ ගෘහමය පරිභෝජනය සඳහා යොදන දර දැව වශයෙන් භාවිතයට ගැනෙන කුඩා දැව සැපයුම හැකිතාක් දුරට තහවුරු කිරීම හා වැඩි දියුණු කිරීම

3. නිවාස ඉදිකිරීම් කටයුතු, කාර්මික පණිවුඩ හුවමාරු සේවා හා ආරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය වන දැව හා අන් වනාන්තර නිෂ්පාදන සැපයුම හැකිතාක් දුරට ඉහළ මට්ටමින් පවත්වා ගෙන යාම.

4. ඉහත සහන් අරමුණුවලට අනුකූලව වන සම්පතින් උපරිම ආර්ථික ප්‍රයෝජන සැලසෙන සේ කටයුතු කිරීම.

5. වන වගා කිරීමේ සමාජමය වැඩ සටහන් මගින් පුද්ගලික දැව වගා සහ වන ගොවි බිම් වගා දිගා කර ගැනීමේලා ප්‍රාදේශීය ප්‍රජාව හවුල් කර ගැනීම.

මෙකී ප්‍රතිපත්තිමය අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන සංවිධාන ව්‍යුහය දැනටමත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගොඩ නගා ඇත. එමෙන්ම සියුම් අන්දමින් වනාන්තර කළමනාකරණය කිරීම, වන පර්යේෂණ, යලි වන වගාව සහ නව වන වගාව, වනාන්තර ආරක්ෂා කිරීම හා සංරක්ෂණය, කෘෂි වන වගාව හා "සහයෝගී" වන වගාව යන මේ අංශයන්ට අදල සම්පූර්ණ හා ක්‍රමානුකූල වැඩ සටහන් එමගින් දියත් කරනු ඇත.




ශ්‍රී ලංකා/ස්විට්සර්ලන්ත චන්ද්‍රිකා ඡායාරූප ව්‍යාපෘතිය විසින් සකස් කරන ලදී. දුර ඡායා මධ්‍යස්ථානය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, කොළඹ.

රූපය II : වන ප්‍රදේශ දැක්වෙන සිතියම. පරිමාව 1 : 2,000,000
(මුල් පරිමාව 1 : 5,000,000)

### ශාක ආරක්ෂාව

වත්මන් පරපුරට දිගින් දිගටම වනාන්තරයෙන් ලබාගත හැකි ප්‍රයෝජන තහවුරු කරමින්, වන සම්පත තුළ ගැප්ව ඇති ප්‍රයෝජනවත් බව අනාගත පරපුරට හිමිවන තියායෙන් එය හඳුරුවා ගැනීම "වන සංරක්ෂණය" යන්නෙන් අදහස් වේ.

තිබෙන ස්ථානයේදීම තිබෙන අයුරින් වන සම්පත සංරක්ෂණය කිරීම, මෙහිලා අනුගමනය කෙරෙන එක් උපක්‍රමයකි. "ස්ථානගත" සංරක්ෂණය යනුවෙන් නම් කර තිබෙන මෙම පිළිවෙළේ අරමුණ වනුයේ ආදර්ශ වනාන්තර ගණනාවක් (ඒවායේ ස්වභාවික පරිසරය තුළම) පවත්වාගෙන යාමයි. ශ්‍රී ලංකාවේ තිවර්තන වැසි වනාන්තරවල දක්නට ලැබෙන ශාක විශේෂ මාලාවක්ම ආරක්ෂා කර ගැනීම පිණිස එය වෙසෙසින් උචිත වන්නකි. මෙබඳු වනාන්තරමය පරිසරීය පද්ධති තුළ පවත්නා ශාක විශේෂවල සංකීර්ණත්වය හා ඒවා ඉතා සමීප ලෙස එකිනෙක මත රඳා පැවැත්ම එම ක්‍රමයේ උචිත බවට හේතුවයි. ස්වභාවික හා ප්‍රකෘති තත්ත්වයන් යටතේ එම වනාන්තරවල ගැප්වන ලක්ෂණ පදනම් කර ගෙන එබඳු ප්‍රදේශ (වනාන්තර හා වන සත්ව) සංරක්ෂණය සඳහා තෝරා ගනු ලැබේ. එම වනාන්තර (ඒවා තුළ ඇති) විශේෂ අතින් පොහොසත්ය. නැතහොත් ඒක දේශීක (අප රටට පමණක් සීමා වූ) විශේෂවලින් ගහණය. සිංහරාජ ජීවගෝල රක්ෂිත ප්‍රදේශය, හෝර්ටන් තැන්නේ ස්වභාවික ආරක්ෂිත ප්‍රදේශය හා ශ්‍රීපාද කන්ද ආශ්‍රිත අභය භූමිය, "ස්ථානගත" සංරක්ෂණ පියවරට තිදර්ශන වේ.

### වන සත්ව ආරක්ෂාව

වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලන ක්ෂේත්‍රයට අයත් ආරක්ෂිත ප්‍රදේශ වර්ග හතරකි. ස්වභාවික වනෝද්‍යාන, දැඩි ආරක්ෂිත ස්වභාවික ප්‍රදේශ, ආරක්ෂිත ස්වභාවික ප්‍රදේශ හා වනාන්තර කපොලු යනුවෙනි. මෙම වර්ග හතරට වැටෙන ආරක්ෂිත ප්‍රදේශ ගණනින් 65 කි. ඒවායේ වර්ග ප්‍රමාණය හෙක්ටෙයාර 780,920 කි. මෙය මුළු රටේ භූමි ප්‍රදේශයෙන් 12 % ක් හෙවත් මුළු වනාන්තර ප්‍රදේශයෙන් 32% ක් පමණ වේ. (පහත වගුව බලන්න).

වගුව 1

**ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂක ප්‍රදේශ සහ අභය භූමිවල විශාලත්වය**

| වර්ගය | ගණන | වර්ග ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|---|
| 1. ජාතික වනෝද්‍යාන | 11 | 459,570 |
| 2. දැඩි ආරක්ෂිත ප්‍රදේශ | 3 | 31,587 |
| 3. ස්වභාවික ආරක්ෂිත ප්‍රදේශ | 2 | 32,562 |
| 4. වනාන්තර කපොලු | 1 | 10,364 |
| 5. අතරමැදි කලාප | 0 | – |
| 6. අභය භූමි | 48 | 246,837 |
| 7. ජාතික ආරක්ෂිත ප්‍රදේශ හා අභය භූමිවල මුළු වර්ග ප්‍රමාණය | | 780,920 |
| 8. රටේ මුළු වනාන්තර ප්‍රදේශයෙන් ප්‍රතිශතයක් වශයෙන් | | 32% |
| 9. රටේ සම්පූර්ණ විශාලත්වයෙන් ප්‍රතිශතයක් වශයෙන් | | 21% |

මූලාශ්‍රය : වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුව

## පරිසර ආරක්‍ෂාව

ස්වභාවික පරිසරය ආරක්‍ෂා කිරීමේලා වනාන්තරවලින් ඉටුවන මෙහෙය පිළිගනිමින්, 1969 දී යුනෙස්කෝව විසින් ජාත්‍යන්තර ජීව විද්‍යා වැඩ සටහන දියත් කරනු ලැබීය. පරිසර සම්පත මනෝඥ අන්දමින් උපයෝගී කර ගැනීම සහ එයට ආරක්‍ෂාව සැලසීම මෙම වැඩ සටහනේ අරමුණු වේ. 1970 දී එය "මිනිසා සහ ජීවගෝල වැඩ සටහන" යනුවෙන් අලුතින් නම් කරන ලදී.

මෙම වැඩ සටහනේ අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකාවෙහි ද කමිටුවක් පිහිටුවනු ලැබීය. ප්‍රධාන ජීව දේශගුණ කලාපවල ඇති සෑම වනාන්තරයකින්ම අක්කර 50 බැගින් වෙන් කර, මොනම අයුරකින් වත් ඒවායේ දැව ඉවත් කිරීම තහංචි කිරීමට එම කමිටුව තීරණය කෙළේය. මෙම වනාන්තර සංඛ්‍යාව දිගින් දිගටම වැඩි කරනු ලැබුයෙන්, අද එවැනි වන පෙත් 47 ක් ඇත. ඒවායේ වර්ග ප්‍රමාණය හෙක්ටෙයාර 120,000 කි. පහත වගුව බලන්න.

තෙත් කලාපයේ සියලුම ආරක්ෂිත වනාන්තර හා යෝජිත (ආරක්ෂිත) වනාන්තරවල දැව සම්පත් වරණාත්මක ලෙස ප්‍රයෝජනයට ගෙන ඇත්තේය. දිගින් දිගටම එක්තරා මට්ටමක අස්වැන්නක් ලබා ගැනීමට හැකිවන පරිද්දෙන් හා පවත්නා වාක්ෂලතාදියට අවම හානියක් සිදුවීමට ඉඩ ලැබෙන නියායෙන් මෙම කටයුත්ත විද්‍යාත්මක පදනමක් මත ඉටු කරන නමුදු, ඒ නිසා ඇතැම් ශාක විශේෂ හා ඒවායේ යළි ප්‍රජනනයට තරමක හානි සිදු වී ඇති බව නිරීක්ෂණය කර තිබේ. කෙසේ වුවද වරණාත්මක දැව උපයෝගිතාව විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ පහත රට තෙත් කලාපීය වනාන්තරවල ජීව විද්‍යාත්මක පරිහානියට ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගෙන ඇත.

## අනෙක් කටයුතු සඳහා වන බිම් යොද ගැනීම

රටේ ජනගහණයෙහි වර්ධනයත් සමගම, ගොවිතැන, නගර හා ගම් පුළුල් කිරීම ආදී කටයුතු සඳහා (වනාන්තරවලට යට වී තිබූ) ඉඩම් කෙරේ වූ ඉල්ලුම ද වැඩි වී ගියේය. මේ අනුව, විශාල වන බිම් වෙන් කර ගෙන, අනෙක් කටයුතු සඳහා යොදවනු ලැබීය. මහවැලි යෝජනා ක්‍රමය යටතේ මෙතෙක් එළි කර ඇති වනාන්තර භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 80,000 ක් පමණ වේ. විවිධ සංවර්ධන යෝජනා ක්‍රම යටතේ පහත රට තෙත් කලාපයේ පිහිටි ස්වභාවික වන බිම් ඉතා විශාල ප්‍රමාණයක් ද අන් කටයුතු සඳහා යොද ගෙන ඇත්තේය. දශක කිහිපයකට පෙර, "ග්‍රාමීය වනාන්තර" නම් ලත් වන පෙත් වර්ගයක් රටපුරාම පවත්වා ගෙන එනු ලැබීය. ඉඩම් අස්වැද්දීම, අනවසරයෙන් ඉඩම් අල්ලා ගැනීම හා සල ගොවිතැන

වගුව 2

**ශ්‍රී ලංකාවේ "මිනිසා හා ජීව ගෝල" වනාන්තර**

| ජීව දේශගුණ කලාපය | ගණන | වර්ග ප්‍රමාණය (හෙක්ටෙයාර) |
|---|---|---|
| පහත රට තෙත් කලාපය | 14 | 19,170 |
| උඩරට තෙත් කලාපය | 10 | 25,037 |
| අතරමැදි කලාප | 6 | 1,170 |
| වියළි කලාපය | 17 | 74,505 |
| මුළු ගණන | 47 | 119,882 |

## ප්‍රශ්න හා ගැටලු

ශ්‍රී ලංකාවේ වනාන්තරමය ජාන සම්පත් සංරක්ෂණයේලා සලකා බැලිය යුතු ප්‍රශ්න කිහිපයක් වෙයි. ඒවා ලුහුඩින් මෙසේය :

## වරණාත්මක දැව උපයෝගිතාව

යටත් පිරිසෙයින් රටේ දැව අවශ්‍යතාවෙන් එක්තරා කොටසක් හෝ සපුරාලනු වස් පහත රට

ආදී කටයුතු නිසා මෙම වන පෙත් දැන් මුළුමනින්ම වාගේ අතුරුදහන් වී ගොස් තිබේ.

ඒවාට පමණක් සීමා වූ ශාක ප්‍රජාවන්ගෙන් යුත් පහත රට තෙත් කලාපයේ රට අභ්‍යන්තර වගුරු බිම් ආශ්‍රිත වනාන්තර ද (වී වගාව සඳහා ඉතාමත් සුදුසුවීමේ හේතුවෙන්) සම්පූර්ණයෙන්ම වාගේ අතුරුදහන් වී ඇත (ගුණතිලක 1985). ඉඩම් අස්වැද්දීම, ගොවිතැන, ඉස්සන් බෝ කරන ගොවිපළවල් ඉදි කිරීම, දර එකතු කිරීමට යොදා ගැනීම ආදී පියවර නිසා වෙරළබඩ ප්‍රදේශ සහ ගංගා මෝයවලට සීමා වූ කඩොලාන වනාන්තර ඉතා තදින් පිරිහී ගොස් තිබේ. ස්වභාවික වනාන්තරවල "වියන" යට, කර්දමුංගු වගාව, තෙත් කලාපීය ස්වභාවික වනාන්තර ජීව විද්‍යාත්මක වශයෙන් පරිහානියට පත් කරවනුසුලු භූමි උපයෝගිතා ක්‍රමයකි. නකල්ස් හා රක්වාන – දෙනියාය කඳු පෙදෙසේ ස්වභාවික වන ආවරණය යට කර්දමුංගු වගා කර තිබේ.

## කාර්ය මණ්ඩල හා පුහුණුවීමේ පහසුකම් හිඟය

හෙක්ටෙයාර මිලියන 1.86 ක් වසා සිටින වනාන්තර ආරක්ෂා කිරීම හා යලි වන වගාව, වනාන්තර විශාල කිරීම, කළමනාකරණය, පර්යේෂණ ආදී අන් සියලු කටයුතු සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව තුළ සිටින මුළු කාර්ය මණ්ඩලය 825 ක් පමණි. ජීව විද්‍යාත්මක අගය පිළිබඳ දෘෂ්ටි කෝණයෙන් බලන කල, වන සම්පත් ප්‍රමාණවත් අයුරින් සංරක්ෂණය කිරීම සඳහා මෙම කාර්ය මණ්ඩලය කිසිසේත් නොසෑහේ. විශේෂයෙන්ම වන සත්ව ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට අදාල පුහුණුවීම් පහසුකම්වල හීනතාව ජාතික වනෝද්‍යාන හා සෙසු ආරක්ෂිත වන සත්ව ප්‍රදේශ කළමනාකරණය කෙරේ බලපාන තවත් ප්‍රබල බාධකයක් වෙයි.

## සල ගොවිතැන

සල ගොවිතැන රටපුරාම වනාන්තරවල තත්ත්වය දුබල කරවනසුලු වැදගත් හේතුවකි. ශ්‍රී ලංකාවේ වනාන්තර ක්ෂය වී යාමට සල ගොවිතැන ප්‍රධාන සාධකයක් වූ බව අතීත අගැයුම්වලින් හෙලි වී ඇත්තේය.

## ස්වභාවික වනාන්තරවල ජීව විද්‍යාත්මක හා පරිසරීය වැදගත්කම පිළිබඳ අවබෝධයක් නොමැතිවීම

ඖෂධීය පැලෑටි, ආහාර හා කෘෂිකාර්මික බෝග සැපයීමේ හැකියාව අතින් සහ පරිසරය කෙරේ දක්වන බලපෑම් අතින් වනාන්තර සතුවන වැදගත්කම සාමාන්‍ය මහජනතාව විසින් නිසි සේ වටහා ගෙන නොමැති බව පෙනේ. වන සංරක්ෂණය මහජනයා වෙත ක්ෂණික ප්‍රතිලාභ ප්‍රදානය කරන්නක් වනුයේ ඉතා කලාතුරකිනි. සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ මනා අවබෝධයක් ප්‍රතිපත්ති සම්පාදකයන් සතුවීම අත්‍යවශ්‍ය කරුණකි. ආරක්ෂිත වනාන්තරවලින් ලබාගත හැකි පරිසරීය හා ජානමය ප්‍රතිලාභ පිළිබඳ මනා වැටහීමක් ඔවුන් සතුවිය යුතුය.

## ස්වභාවික වනාන්තරවල ජීව විද්‍යාත්මක වැදගත්කම පිළිබඳ අවබෝධයක් නොමැති වීම

ඖෂධ, ආහාර ද්‍රව්‍ය, උයන් වගාව ආදී අංශ සම්බන්ධයෙන් අපේ වනාන්තරවල තිබෙන ශාක විශේෂ සතු ප්‍රයෝජනවත් බව තවමත් මුළුමනින් වටහා ගෙන නැත.

## දැනට පවත්නා ආරක්ෂිත ප්‍රදේශ පද්ධතිය පිළිබඳ සමාලෝචනය

වනාන්තර ආවරණයේ වර්තමාන ක්ෂයවීම් හා පරිහානි වේගය ගැන සිතන විට, ඒවායේ වත්මන් තත්ත්වය සහ රටේ පවත්නා ආරක්ෂිත වන පෙත් පද්ධතිය පිළිබඳව සමලෝචනයක් කිරීම අත්‍යවශ්‍ය වේ. නිවර්තන කලාපීය පරිසර පද්ධති මාලාව සම්පූර්ණයෙන් අඩුවන නියායෙන් හා සමාජයීය – ආර්ථික වැදගත්කමින් යුත් විශේෂයන්ගේ ජානමය සම්පත් ඇතුළත් වන පරිද්දෙන්, ආරක්ෂිත ප්‍රදේශ ජාලාවක් පිහිටුවිය යුතු වෙයි. කඩොලාන වනාන්තර, සැවනා වනාන්තර, පතන තණ බිම් ආදිය මීට අදල නිදසුන් කිහිපයකි.

## හරි පැත්තට තැබූ පියවර..........

පරිසරය සුරැකීම හා වැඩිදියුණු කිරීම, පාංශු හා ජල සම්පත් රැක ගැනීම, දේශීය ශාක හා සත්ත්ව විශේෂ ආරක්ෂා කිරීම යන මේවා ඉටු කරන අතරම, දිගින් දිගටම ප්‍රයෝජනයට ගත හැකි වන සේ දැව

හා අනෙක් වනාන්තර නිෂ්පාදන අස්වැන්න සාධාරණ මට්ටමකින් පවත්වා ගෙන යාම යන මේ අරමුණු සඳහා වනාන්තර ආරක්‍ෂා කොට වගා දිගා කර ගැනීම වන කළමනාකරණයේ ප්‍රාථමික අරමුණ වෙයි. මෙකී අරමුණු පෙරදැරි කර ගනිමින්, ශ්‍රී ලංකාවේ ස්වභාවික වනාන්තර සංරක්ෂණය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන විද්‍යා අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය විසින් පහත දැක්වෙන උපක්‍රම අනුගමනය කෙරේ.

## වනාන්තර සංවර්ධන මහ සැලැස්ම

වන සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය විසින් ලෝක බැංකුවේ සහාය ඇතිව, 1986 දී වනාන්තර සංවර්ධන මහ සැලැස්ම සකස් කරන ලදී. නිෂ්පාදන අරමුණ, සංරක්ෂණ හා ආරක්‍ෂක අරමුණ, සමාජයීය හා ආර්ථික අරමුණ, යන මේවා මහ සැලැස්ම විසින් සැලකිල්ලට ගෙන ඇත.

## සංරක්ෂණ සමාලෝචනය

පසු අවස්ථාවකදී වනාන්තර සංවර්ධනය පිළිබඳ මහ සැලැස්මේ සඳහන් මුල් නිර්දේශවලින් සමහරක් පරිසරීය වශයෙන් හානිකර ලෙස සලකනු ලැබීය. මෙය වෙසෙසින්ම අදාළ වූයේ ජාන සම්පත් සංරක්ෂණය සම්බන්ධයෙනි. මෙම ප්‍රශ්නය විසඳලනු වස්, ජීව විද්‍යාත්මක විවිධත්වය පවත්වා ගෙන යාම හා දේශීය අනන්‍යතාව සුරැකීම සම්බන්ධයෙන් වැදගත්කමක් උසුලන ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා තෙත් කලාපීය මහ සැලැස්ම සමාලෝචනය කිරීමට රජය විසින් තීරණය කර ඇත්තේය. එවැනි පෙදෙස්වල දැව කටයුතු කිරීම මුළුමනින්ම තහංචි වනු ඇත. එමෙන්ම, තෙත් කලාපයේ ස්වභාවික වනාන්තරවල ජාන සම්පත් සංරක්ෂණය සඳහා ඒවා ආරක්ෂිත තත්ත්වයෙන් පවත්වා ගෙන යනු ඇත.

## වන විද්‍යාවට අදාල පරිසර කළමනාකරණය

වනාන්තර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති තුළ පරිසර කළමනාකරණ අංශයක් ද ඇතුළු කිරීමට ගන්නා ලද තීරණය වනාන්තරමය ජාන සම්පත් සංරක්‍ෂණය උදෙසා තබන ලද තවත් වැදගත් පියවරකි. මේ අනුව, වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව යටතේ වෙනම අංශයක් පවත්වනු ඇත. වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව, වන සත්ව ආරක්‍ෂක දෙපාර්තමේන්තුව, දැව සංස්ථාව හා අනෙක් ආයතන විසින් කරනු ලබන වනාන්තර හා සම්බන්ධ සියලු සැලසුම් හා කළමනාකරණ කටයුතුවලදී ජීව විද්‍යාත්මක විවිධත්වය පවත්වාගෙන යාම ද ඇතුළත් සියලු සංරක්‍ෂණ ප්‍රශ්න ප්‍රමාණවත් අන්දමින් සැලකිල්ලට භාජනය කරවීම තහවුරු කරලීම මෙකී පරිසර කළමනාකරණ අංශය පිහිටුවීමේ ප්‍රාථමික අරමුණ වේ.

## ජාතික සංරක්‍ෂණ උපාය මාර්ගය

ගරු ජනාධිපතිතුමාගේ නියෝගය පරිදි 1988 දී සකසන ලද ශ්‍රී ලංකා ජාතික සංරක්‍ෂණ උපාය මාර්ගය විසින් ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් වේගයෙන් ක්‍ෂය වී යාම ගැන විභාග කර ඇත. රටේ වන බිම් අක්‍රමවත් ලෙස අන් කටයුතු සඳහා යොදා ගැනීම නවත්වා දමන ලෙස ද අනාගතයේදී සිදු කෙරෙන එබඳු කටයුතු (යෝජිත) ජාතික ඉඩම් උපයෝගිතා අධිකාරියේ අගැයීමට භාජන කළයුතු බව ද එමගින් නිර්දේශ කර ඇත්තේය.

## පරිසරමය බලපෑම් අගැයුම

ස්වභාවික සම්පත් ඉතා දරුණු අන්දමින් ප්‍රයෝජනයට ගනු ලබන නිසා, සියලු සංවර්ධන වැඩ සටහන් පරිසරමය බලපෑම් අගැයුමට ලක් කළ යුතු බව ජාතික සංරක්‍ෂණ උපාය මාර්ගය විසින් නිර්දේශ කර තිබෙන අතර, ජාතික පරිසර පනතට ද ඇතුළත් කර තිබේ. අනාගතයේදී වනාන්තර අංශමය සංවර්ධන ව්‍යාපෘතිය ද ඇතුළත් වනාන්තරමය ව්‍යාපෘති සියල්ල අනුමත කිරීමට පෙර, පරිසරමය බලපෑම් අගැයුමට භාජනය කෙරේ. මෙය (එබඳු පියවර නිසා උද්ගත විය හැකි) අහිතකර පාරිසරික ප්‍රතිඵල වැළැක්වීමේ ආරක්‍ෂක පිළිවෙතක් වනු ඇත.

## වන වගා ඉදි කිරීම

රටේ කාර්මික දැව හා දර සැපයුම් හිඟය පිරිමසා ලනු සඳහා වන වගා ඉදි කෙරේ. ක්‍රි.ව. 2000 ට පෙර හෙක්ටෙයාර 150,000 ක් විශාල මෙබඳු වන වගා ඉදි කිරීමට යෝජිතයි. ස්වභාවික වනාන්තර කෙරේ එල්ල වන තර්ජනය අඩු කරමින් දැව හිඟය පිරිමසාලීමට තරම් ප්‍රමාණවත් දැව සම්භාරයක් සැපයීමට එය සමත් වනු ඇත.

## සහයෝගී වන වගාව

සමාජයීය වන වගා වැඩ සටහන් අනුසාරයෙන් වනාන්තර කටයුතු සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීමේදී ඒ ඒ පලාතේ ප්‍රජාව වැඩි වැඩියෙන් එම කටයුතුවලට සහභාගි කර ගැනීමට බලාපොරොත්තු වනු ලැබේ. වන සංරක්ෂණ වැඩ සටහන් සැලසුම හා ඊට අදල තීරණ ගැනීමේදී ඒ සඳහා පලාතේ ප්‍රජාව හවුල් කර ගැනීම සහ ග්‍රාමීය සංවිධාන හා සමාජ – ආර්ථික සමීක්ෂණ අනුසාරයෙන් ඔවුන්ගේ අදහස් උදහස් විමසා බැලීම ආදිය සිදු කෙරේ.

## පාරිසරික අධ්‍යාපනය හා අවබෝධ කරවීමේ වැඩ සටහන්

මහ ජනතාව සහ පාසැල් ළමුන් සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පාරිසරික අධ්‍යාපනය සහ අවබෝධ කරවීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරයි.

## පර්යේෂණ කටයුතු පුළුල් කිරීම

සංරක්ෂණ පර්යේෂණ ද ඇතුළත් වූ, වනාන්තරමය පර්යේෂණයේ සියලුම වැදගත් ක්ෂේත්‍ර අඩුවන පරිදි වන පර්යේෂණ කටයුතු ව්‍යාප්ත කළයුතු වේ.

ජාත්‍යන්තර සම්බන්ධීකරණය සහිත වූ "මිනිසා සහ ජීවගෝලය" වැනි වැඩ සටහන් මත ගොඩ නැගුණු ජාතික වැඩ සටහන් යටතේ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සත්ව ආරක්ෂක දෙපාර්තමේන්තුව, විශ්ව විද්‍යාල ආදී ආයතන ගණනාවක් මගින් මෙම පර්යේෂණ කටයුතු ඉටු කළ හැකිය.

## ක්‍රියාත්මක කරවීම සඳහා නිර්දේශ

1. වනාන්තරමය ජාන සම්පත් සංරක්ෂණය සඳහා සංරක්ෂණ සමාලෝචනය මගින් හඳුනා ගන්නා ක්ෂේත්‍ර "මිනිසා සහ ජීවගෝල" වැඩ සටහනට ඇතුළත් කළ යුතුය.

2. පරිසරීය පද්ධති සියල්ල හා සමාජ–ආර්ථික වැදගත්කමක් උසුලන විශේෂවල ජාන සම්පත් අඩුවන නියායෙන් දැනට රටේ පවත්නා මිනිසා හා ජීවගෝල ආරක්ෂික ප්‍රදේශ ක්‍රමය සමාලෝචනය කළ යුතුය.

3. මිනිසා හා ජීවගෝල ආරක්ෂිත කලාප නීත්‍යානුකූලව පිළිගත යුතුය. පාර්ලිමේන්තු පනතකින් හැර අන් කවර තත්ත්වයක් යටතේ වත් එම කලාපවල දැව එළීම හා ඒවා වෙනත් කටයුතුවලට යොදා ගැනීම තහනම් කළ යුතුය.

4. ජනතාව හා සොබා දහම අතර සමීප සම්බන්ධතා ඇතිවන අවස්ථා ප්‍රයෝජනයට ගත යුතුය. සංරක්ෂණයේ පරමාර්ථ මානව වර්ගයාගේ පැවැත්මට හා සුභ සිද්ධියට එය ඉවහල් වන අන්දම විස්තර කෙරෙන ප්‍රචාරක ද්‍රව්‍ය හා දැන්වීම් පුවරු ආදිය ජාතික වනෝද්‍යාන, සිංහරාජ වනය, උද්භිද හා සත්ත්ව උද්‍යාන වැනි ස්ථානවලට සැපයිය යුතුය.

හැමද අප සමගින් වැජඹෙන්ටයි.............

## උද්භිද උද්‍යාන මගින් ආරක්ෂාව සැලසීම – "බාහිර ස්ථානගත සංරක්ෂණය"

### පරමාර්ථය හා යථාර්ථය

ඉතා විවිධ අන්දමේ ශාක පැවතීම නිවර්තන කලාපීය ප්‍රදේශවල විශේෂ ලක්ෂණයකි. එය ඉතාමත් සංකීර්ණ අන්දමින් පවත්නේ සමකාසන්න පෙදෙස්වලයි. අක්ෂාංශ වැඩි වන්නාහාම (සමකයේ සිට වඩ වඩා උතුරු හෝ දකුණු දිගට යත්ම) අනුක්‍රමයෙන් ශාක ජීවිතයේ විවිධත්වය ද හීන වී යයි. නිවර්තන කලාපීය වනාන්තර අතර වුවද ශාක විවිධත්වය ඉහළ මට්ටමින් දක්නට ලැබෙනුයේ එබන්දක් සඳහා ඉතා හිතකර තත්වයන් සහිත වූ ලැටරයිට් (කබොක්) පස් ඇති භූමි භාගවලය.

සත්ව ජීවිතයේ විවිධත්වයෙහි පරිණාමයට හා පැවැත්මට ශාක විවිධත්වය පදනම් වේ. මේ අනුව, සත්ව හා ශාක ජීවිතය එය තිබෙන ස්ථානයේදීම ආරක්ෂා කර ගැනීම (ස්ථානගත සංරක්ෂණය) ජාන සංරක්ෂණයේලා අනුගමනය කළයුතු ඉතාමත් යහපත් උපක්‍රමය වේ.

එහෙත්, ක්‍රියාත්මක අන්දමින් බලන කල, එබඳු ප්‍රතිපත්තියක් පුළුල් අයුරින් භාවිතා කිරීම සීමා කරවනුසුලු ප්‍රබල බාධක රැසක් පවතියි. එබැවින්, මනා ප්‍රතිඵල අත්පත් කර ගැනීමට නම්, මුහුණුවර කිහිපයකින් යුත් පිළිවෙතක් අනුගමනය කිරීම අවශ්‍යය. ජාන සංරක්ෂණයට අදල සැලකිය යුතු දැනුම් හා අත්දැකුම් සමභාරයක් අද අප සතුව ඇත. මෙම ක්ෂේත්‍රය හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන සිය විශේෂ අවධානය යොමු කරනුයේ උසස් ප්‍රමුඛතාවෙන් යුත් විශේෂ කෙරෙහිය. මේ අනුව, ඖෂධීය හා සුගන්ධකාරක ද්‍රව්‍ය වශයෙන් දේශීය ආර්ථිකයට වැදගත් වන හෝ, පාරිසරික හෝ විද්‍යාත්මක අතින් හෝ දේශීය වැදගත්කමක් සහිත දහස් සංඛ්‍යාත වල් පැලැටි ශාකවල ජාන සම්භාරය ආරක්ෂා කර ගැනීම උද්භිද උද්‍යාන භාරකරුවන්ගේ සේවයක් ලෙස සැලකේ. උද්භිද උද්‍යාන විසින් උසස් පෙළේ සේවයක් ඉටු කළයුතුයේ මේ සම්බන්ධයෙනි.

### උද්භිද උද්‍යානයක් යනු කුමක්ද?

උද්භිද උද්‍යානයක් යනු විද්‍යාත්මක හෝ උද්භිද විද්‍යාත්මක පර්යේෂණ, අධ්‍යාපන, ප්‍රදර්ශන හා විනෝදාත්මක කටයුතු උදෙසා වෘක්ෂලතාදිය වගා කෙරෙන ස්ථානයකි.

ප්‍රසිද්ධ උද්‍යාන ද ප්‍රදර්ශන හා විනෝදමය සේවා ඉටු කරයි. එහෙත්, ඒවා උද්භිද උද්‍යාන නොවේ. එමෙන්ම, විද්‍යාත්මක හා අධ්‍යාපනික අරමුණු පර්යේෂණ හා ශාක බෝ කරන මධ්‍යස්ථානවල කටයුතු තුළට ඇතුළත්ය. ඒවාද උද්භිද උද්‍යාන ගණයට අයත් නොවේ. නව දේ සොයා යන විද්‍යාඥයාට, කල්පනා ලෝකයට පිවිසෙන කලාකරුවාට, පෙමින් වෙළුනු තරුණ යුවලට, කෙළි ලොල් දරු දැරියන්ට එකසේ යෝග්‍ය වූ පහසුකමක් උද්භිද උද්‍යානයෙන් සැලසේ.

මේ අනුව, උද්භිද උද්‍යානයෙන් කටයුතු රැසක් ඉටුවන බව පෙනේ. එය ප්‍රබල සංරක්ෂණ අවියක් වනුයේද එකී කටයුතුවල ඒකාබද්ධතාව නිසාය.

### උද්භිද උද්‍යානයේ අතීත කථාව

අප දන්නා ආදීතම උද්භිද උද්‍යාන පිහිටුවන ලද්දේ යුරෝපයේය. දහසයවැනි හා දහහත්වැනි ශතවර්ෂ තුළදී ඒවා ඖෂධීය උද්‍යාන වශයෙන් බොහෝ විට වෛද්‍ය ආයතන හා සම්බන්ධව පැවතිණ. එබඳු ප්‍රථම උද්‍යානය ක්‍රි.ව. 1543 දී ඉතාලියේ පීසා නුවර අරඹනු ලැබීය. පසුව, ප්‍රංශය, ස්විට්සර්ලන්තය, එංගලන්තය, ජර්මනිය සහ ඕලන්දය යන රටවල ද ඊට සමාන උද්‍යාන රැසක් පිහිටුවන ලදී.

ශාක වර්ගීකරණය හඳුන්වාදීමේ ප්‍රතිඵලයක් වශයෙන් 18 වැනි සියවසේදී මෙම උද්‍යානවල ස්වභාවය වෙනස් වන්නට පටන් ගත්තේය. බොහොමයක් උද්භිද උද්‍යාන ශාක එකතු කිරීම, වර්ගීකරණය හා නව ශාක සොයා ගැනීම ආදී කටයුතුවල නියැලි ආයතන බවට පරිවර්තනය විය. ඒ සමඟම වැදගත් ශාක උද්‍යාන රැසක් ද අරඹන ලදී. මෙය යටත් විජිත සංවර්ධනය

හා අත්වැල් බැඳ ගත්තකි. වෘත්තීය ශාක වර්ගීකරණය 18 වැනි හා 19 වැනි සියවස් තුළ වැදගත් තේමාවක් සේ පැවැත්තේය. මෙම සියවස් "ශාක යුගය" ලෙස හැඳින්විය හැක.

**ශ්‍රී ලංකාවේ............**

ප්‍රථම වරට කොළඹ පිහිටුවන ලද උද්භිද උද්‍යානය වසර කීපයකට පසු අගලවත්තට ගෙන යන ලදී. ඉක්බිති 1821 දී එය පේරාදෙණියෙහි පැලපදියම් විය. 1861 දී හග්ගල සහ 1876 දී හෙනරත්ගොඩ උද්‍යාන අරඹනු ලැබීය. 1833 දී අනුරාධපුරයෙහි සහ 1886 දී බදුල්ලෙහි වශයෙන් තවත් උද්භිද උද්‍යාන දෙකක් ද පිහිටුවනු ලැබීය. දේශීය ශාක ගවේෂණය, දේශීය ආර්ථිකයට හා දිවයිනේ අලංකාරයට යෝග්‍ය, ප්‍රයෝජනවත් නව වෘක්ෂලතාදිය හඳුන්වා දීම ආදිය ඒවායේ සේවය අතර විය. මේ අනුව, ප්‍රධාන ආර්ථික බෝග සියල්ලම ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදුයේ උද්භිද උද්‍යාන විසිනි. ඒ මෙසේය :

| | | |
|---|---|---|
| සින්කෝනා | – | 1861 |
| තේ | – | 1864 |
| රබර් | – | 1876 |
| කොකෝ } කුළුබඩු | – | 19 වැනි සියවස |
| විසිතුරු පැලෑටි | – | 20 වැනි සියවස |

**සේවය පුළුල් වෙයි**

වසරින් වසර, ලෝකයේ උද්භිද උද්‍යාන ද ඒවායේ සංඛ්‍යාව, එකතු කළ වෘක්ෂලතාදියේ ගණන, ප්‍රමාණය, නරඹන්නට එන පිරිස් සංඛ්‍යාව ආදී අංශවලින් වැඩී යන්නට විය. ශ්‍රී ලංකාවේ සිදුවූයේ ද ඊට සමාන දෙයකි. මෙරට උද්භිද උද්‍යාන වෙත එවන නරඹන්නන් සංඛ්‍යාව දස ලක්ෂණයක් පමණ වේ යයි ගණන් බලා තිබේ. මුළු ලෝකයේ උද්භිද උද්‍යාන වෙත එන පිරිස් දස කෝටිය ඉක්මවන බවට ඇස්තමේන්තු කර ඇත්තේය.

මේ සමගම, උද්භිද උද්‍යානවල ස්වභාවය සහ ඒවායින් අපේක්ෂිත සේවය ද සෙමෙන් සෙමෙන් විකාශනය වන්නට විය. හුදෙක් පැලෑටි එකතුවක් නොව කෘෂිකර්මය, වන විද්‍යාව හා එබඳු අන් කටයුතුවලට ද උද්භිද උද්‍යාන සම්බන්ධවීමට පටන් ගති. මෙබඳු කටයුතු වැඩිදියුණු වත්ම බොහෝ ක්ෂේත්‍රවලට අදාල විශේෂඥ ආයතන බිහි විය. මේ අනුව ක්‍රි.ව. 1887 දී ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ද 1912 දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ද පිහිටුවනු ලැබීය. කෙසේ වෙතත්, උද්භිද උද්‍යාන විශේෂඥ පර්යේෂණ ක්ෂේත්‍රවල දිගින් දිගටම තියැලී ඇත.

ලොව පුරා පිහිටි උද්භිද උද්‍යාන මගින් ලබා ගන්නා ලද අතිමහත් දැනුම් සම්භාරය හා පුළුල් අත්දැකීම් ප්‍රයෝජනවත් ලෙස ජාත්‍යන්තර මට්ටමෙන් භාවිතයේ යොදා ගෙන ඇත්තේය. නිදසුනක් වශයෙන් වඳ වී යන වෘක්ෂලතාදිය පිළිබඳ ප්‍රථම සාකච්ඡාව 1923 දී (පැරිසියේදී) හා දෙවැන්න 1931 දී පවත්වනු ලැබීය. මෙහිදී පහත සඳහන් වැදගත් තීරණයට එළඹ ගන්නා ලදී.

"දුර්ලභ ගණයේ හෝ වඳ වී යාමේ තර්ජනයට මුහුණ පා ඇති හෝ ශාක වර්ග උද්භිද උද්‍යානවල වගා කොට සංරක්ෂණය කළ යුතුය."

එතැනින් පසු, සාකච්ඡා හා සම්මේලන මහා රාශියක් පවත්වන ලදී. උද්භිද උද්‍යාන ඇසුරෙන් ශාක සංරක්ෂණය කිරීම වැදගත් තේමාවක් බවට පෙරළෙමින් පවතියි. අදාළ විෂයයන් අරබයා සම්මේලන රැසක් පවත්වා ඇත, ලිපි මහා රාශියක් සකස් කර ඇත.

රටවල් 26 ක සහභාගිත්වයෙන් 1975 දී සෝවියට් සංගමයෙහි පවත්වන ලද එක් වැදගත් සම්මේලනයකදී මතු සඳහන් නිර්දේශ ඉදිරිපත් විය :

ලොව පුරා ඇති උද්භිද උද්‍යාන විසින් පහත දැක්වෙන කටයුතු ඉටු කළ යුතුය :

1. වගා කෙරෙන හා නොකෙරෙන යන දෙවර්ගයටම අයත් වූ දුර්ලභ සහ වඳ වී යන ශාක විශේෂවලට අදාළ ජීව විද්‍යාත්මක හා පාරිසරික අධ්‍යයන තියුණු කළ යුතුය.

2. වඳ වී යන විශේෂ වගා කිරීමේ උපක්‍රම සකස් කළ යුතුය, වගා කිරීමේලා පෙරමුණ ගත යුතුය.

3. දේශීය ශාක වර්ග අධ්‍යයනය කරන අතරම, අනතුරකට මුහුණ පා සිටින ප්‍රදේශ ආරක්ෂා කළ යුතුය.

4. හැකි සෑම අයුරින්ම, සංරක්ෂණය පිළිබඳ මහජන අවබෝධය වැඩි දියුණු කළ යුතුය.

ඉන්පසු එළඹුණු වසරවලදී ද ඊට සමාන සාකච්ඡාවන් පැවැත්විණ. 1975 හා 1978 දී එංගලන්තයේ කිව් රාජකීය උද්භිද උද්‍යානයේදී පැවැත්වුණු සම්මේලන ඊට නිදසුනකි. ජගත් සංරක්ෂණ උපාය මාර්ග IUCN මගින් 1980 දී පළ කෙරිණ.

WWF / IUCN / ලෝක ආහාර සංවිධානය / යුනෙස්කෝව හා UNEP විසින් 1985 දී වැදගත් පියවරක් ගන්නා ලදී. ලෝකයේ රටවල් 39 කින් පැමිණි විශේෂඥවරු, ශිෂ්‍යයෝ සහ ශාක හා උද්භිද උද්‍යාන ගැන උනන්දුවක් දැක්වූ සෙසු අය 200 කට වැඩි ගණනක් මෙම සම්මේලනයට හවුල් වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉතා වැදගත් නිර්දේශ ගණනාවක් ඉදිරිපත් විය.

### වර්තමාන මෙහෙවර

උද්භිද උද්‍යානවලින් අපේක්ෂිත මෙහෙය කිමෙක්ද යනු 1985 සම්මේලන නිර්දේශවලින් පැහැදිලි වේ. ශ්‍රී ලංකාවට අදාළ තරමින්, මෙකී නිර්දේශ සහ තීරණ ලුහුඬින් පහත දැක්වේ.

1. **"බාහිර ස්ථානගත" සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම**

ජාන සම්භාර ලෙස ප්‍රයෝජනයට ගත හැකි අතිවිශාල ශාක ප්‍රජාවන් සිය සජීවී ශාක එකතුව තුළ පවත්වා ගෙන යාම, උද්භිද උද්‍යානවලට නොකට හැක්කකි. මෙය කළ යුත්තේ ස්ථානගත සංරක්ෂණ මාර්ගයෙනි. එබැවින්, ශාක විශේෂවලට අදාල, "බාහිර ස්ථානගත" සංරක්ෂණ කටයුතුවලට උද්භිද උද්‍යාන හවුල් විය යුතුය. මේ අනුව, බොහෝ ශාක විශේෂවලින් නොකැඩී ඉතිරි වූ අවසාන සාමාජිකයන් දක්නට ලැබුණේ උද්භිද උද්‍යාන තුළදීය. වඳ වී යාමේ තර්ජනයට මුහුණ පා සිටින ශාක මධ්‍යස්ථානයක් දැන් පේරාදෙණිය උද්භිද උද්‍යානයෙහි පිහිටුවා ඇත. ස්වාභාවිකව වැඩුණු ස්ථානවලින් බැහැර පෙදෙස්වල ශාක වගා කිරීමට අදාළ දත්ත එකතුව මෙම මධ්‍යස්ථානයෙන් අපේක්ෂිත සේවය වේ.

2. **සත්තිවේදනය**

උද්භිද උද්‍යානය නමැති කවුළුවෙන් ශාක ලෝකය නැරඹීම සඳහා එය වෙත පැමිණෙන ලක්ෂ සංඛ්‍යාත ජනී ජනයාට ශාක සංරක්ෂණයේ වැදගත්කම වටහා දීම සහ අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

3. **සංරක්ෂණ හැකියාව වගා දිගා කර ගැනීම**

උද්භිද උද්‍යාන කාර්ය මණ්ඩලයේ හැකියා සංවර්ධනය කර ගනිමින් ශිෂ්‍යයන් හා ජනතාව අතර එය පැතිරවීමේ උපක්‍රමයෙන් මෙම කටයුතු ඉටු කෙරේ. ආයතනමය සංවර්ධනය සහ ව්‍යාප්ති යන දෙවගීයටම අයත් කටයුතු දැන් ක්‍රියාත්මකයි.

4. **ආර්ථික ප්‍රයෝජන සහිත නිදැල්ලේ වැවෙන ශාක සංරක්ෂණය**

වගා බෝගවලට නෑකම් දක්වන නිදැල්ලේ වැවෙන ශාක විශේෂ සහ ඒවා පැතිර පවත්නා ස්ථාන සොයා ගැනීම. ජාන බැංකු හා බීජ ගබඩා මාර්ගයෙන් සංරක්ෂණය කිරීම.

### සමාප්තිය

අප ඉදිරියේ ඇති අනාගත අභියෝගය කිමෙක්දැයි එකම වැකියකින් පවසන්නට පුළුවන. "අප විසින් රැක බලා ගත යුතු ජීව විද්‍යාත්මක දායාදයේ තරාතිරම කිමෙක්දැයි අපි නොදනිමු".

වගුව 1

**ප්‍රධාන ශාක කණ්ඩායම්වලට අයත් විශේෂ ගණන**

| රාජධානිය | බෙදුම | පොදු නාමය/නිදසුන් | විශේෂ ගණන (ආසන්න වශයෙන්) |
|---|---|---|---|
| Monera | | Bacteria | 2500 archaebacteria |
| | | | ඇතැම් විට 200 cyanobacteria |
| Fungi | | Fungi | 100,000 |
| Protista | Rhodophyta | Red algae | 4000 |
| | Phaeophyta | Brown algae | 1500 |
| | Chlorophyta | Green algae | 7000 |
| | Chrysophyta | Chrysophytes | 6650 |
| | | diatoms | |
| | Pyrrhophyta | | 1100 |
| | Others | | 1000 |
| Plantae | Bryophyta | Liverworts | 16000 |
| | | mosses | 6000 liverworts |
| | | hornworts | 100 hornworts |
| | | 9500 | 9500 mosses |
| | Psilopsida | Psilopsida | කීපයක් |
| | Lycophyta | Clubmosses | 1000 |
| | Sphenophyta | Horsetails | 60 |
| | Pteridophyta | Ferns | 12,000 |
| | Coniferophyta | Conifers | 550 |
| | Cycadophyta | Cycade | 100 |
| | Ginkgophyta | Ginkge | 1 |
| | Gnetophyta | Gnetophytes | 70 |
| | Anthophyta | Flowering Plants | 235,000 - 250,000 |

මූලාශ්‍රය : ප්‍රධාන වශයෙන් : රේවන් පී. එච්. ආදීන්. Biology of Plants, 4th Ed. (1986)

# නැත ලොව අන් තැන මෙවන් අසිරියක්!

## ශ්‍රී ලංකාවේ දේශීය සත්ව සම්පත

### සමාන්තර විවිධත්වය

ශ්‍රී ලංකාව ශාක විවිධත්වය අතින් ඉතා පොහොසත්ය. දේශීය සත්ව සම්පතෙහි දක්නට ලැබෙනුයේ ද ඊට සමාන්තර තත්ත්වයකි. මෙවන් විවිධත්වයකට හේතු සෙවිය යුත්තේ සත්ව භූගෝලීය ඉතිහාසය, භූමි ලක්ෂණ හා දේශගුණ විවිධත්වය ආදී සාධක තුළිනි.

### භූගෝලීය සම්බන්ධය

විද්‍යාඥයන්ගේ මතය අනුව ශ්‍රී ලංකාව වූකලී, වසර මිලියන 75.7 කට ඉහතදී දකුණු අප්‍රිකාව, ආසියාව, ඕස්ට්‍රේලියාව හා දකුණු ඇමෙරිකාව වශයෙන් බිඳී වෙන්වුණු ගොන්ඩ්වානාලන්තයේ කොටසක් ලෙස පැවති පෙදෙසකි. පශ්චාත් ක්‍රේටේෂස් හෝ ආදී ටර්ෂරි යුගයේදී ඉන්දියාව සම්පූර්ණයෙන්ම ඇන්ටාර්ක්ටිකාවෙන් වෙන් විය. මයෝසීන යුගයේදී ඉන්දියානු උප මහාද්වීපයෙන් ශ්‍රී ලංකාව බිඳී වෙන් වවුද පහළ ප්ලියෝසීන යුගයේදී සිදු වූ මුහුදු පත්ල උඩට නෙරා යාමක් නිසා යළිදු ඉන්දියාවට සම්බන්ධ විය. මින් වසර 25,000 ක් තරම් මෑත කාලයේදී පවා දෙරට අතර භූමි සම්බන්ධතාවයක් තිබූ බව පෙනේ.

භූ විද්‍යාත්මක, දේශගුණික හා භූමියේ උස ආදී හේතු නිසා සමාන ලක්ෂණවලින් සමන්විත පාරිසරික "දිවයින්" නිර්මාණය වී තිබෙන බව ද විශ්වාස කෙරේ. ආදී කල්පික දේශීය සත්ව විශේෂවලින් දැනට ඉතිරි වී තිබෙන න්ෂටාවශේෂ ගැන බලන විට එබඳු තීරණයකට එළඹීමට පුළුවන.

දේශීය ශාක හා සත්ව විශේෂ පරිණාමය කෙරේ මෙකී භූගෝලීය සාධක තදින් බලපා ඇත. උප විශේෂ පරිණාමයේලා භූමි ලක්ෂණ හා දේශගුණික සාධක ආධාර වී තිබෙන බව පෙනී යයි.

පරිණාමීය වශයෙන් වඩාත් පැරණි වූ වංශයන් අතර දේශීය ගණ හා විශේෂවල ඉහළ ප්‍රතිශතයක් දක්නට ලැබෙන අතර, වඩා "අලුත්" වංශ අතර දක්නට ලැබෙනුයේ ඉහළ ප්‍රතිශතයක පවත්නා උප විශේෂ සංඛ්‍යාවකි. වැඩි කලක් මුළුල්ලේ හුදෙකලාව පැවති "පැරණි" වංශ දේශීය ගණ හා විශේෂවලට පරිණාමය වී ඇත. එහෙත්, භූමි ලක්ෂණ හා කාලගුණ විචල්‍යතාවන්ට භාජන වූ "තරුණ" වංශ මෑතක සිට "හුදෙකලා" ලක්ෂණ ප්‍රදර්ශණය කරන බව පෙනේ. මේ අනුව, එම වංශ අතර තුලනාත්මක වශයෙන් වැඩි සංඛ්‍යාවක උප විශේෂ විද්‍යමාන වෙයි.

### මවුන් සැරිසරන්නේ..............

දේශීය සත්ව විශේෂ බොහොමයක් සීමිත ප්‍රදේශ තුළ පමණක් දක්නට ලැබීම අපේ රටෙහි විශේෂ ලක්ෂණයකි. අපූර්ව ලෙස පැතිර සිටින ඇතැම් විශේෂ ද වෙයි.

ශාක මෙන්ම දේශීය සත්ව විශේෂවලින් බහුතරය ද තෙත් කලාපයේ දක්නට ලැබෙන අතර, ඒ හේතුව නිසාම වඳ වී යාමේ තර්ජනයට තදින් මුහුණ පා ඇත.

### හෙට ප්‍රමාද වැඩියි!

ශ්‍රී ලංකාවේ දේශීය සත්ව ජීවිතය ඉතා විවිධ වුවද ඒ සම්බන්ධ දැනුම ඉතාමත් අල්පය. ඇතැම් විශේෂ අඩු වී ගොස් තිබෙන බව අප දන්නා නමුදු කලින් කල නව වර්ග හා විශේෂ සමුවෙයි. ඒ සියල්ල අප විසින් අප්‍රමාදව අධ්‍යයන කළ යුතු ජාන සම්පතකි.

ශ්‍රී ලංකාවේ සත්ව ජීවිතය පිළිබඳව සිත් අලවන තොරතුරු පහත වගුවල එයි.

## වගුව 1 (කෲස් - 1984)

### ශ්‍රී ලංකාවේ දේශ්‍යභ්‍යන්තර පෘෂ්ඨ වංශියෝ

| | ගණ සංඛ්‍යාව | දේශීය ගණ සංඛ්‍යාව | විශේෂ සංඛ්‍යාව | දේශීය විශේෂ සංඛ්‍යාව | විශේෂ හා උප විශේෂ සංඛ්‍යාව | දේශීය විශේෂ හා උප විශේෂ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| Pisces (පිටරටින් ගෙන ආ විශේෂ හැර) | 32 | 3 (9%) | 59 | 16 (27%) | 62 | 28 (45%) |
| Amphibia | 10 | 1 (10%) | 37 | 19 (51%) | 37 | 19 (51%) |
| Reptile | 68 | 12 (19%) | 139 | 72 (51%) | 159 | 98 (62%) |
| Aves (Resident) | 165 | 0 | 237 | 20-21 | 248 | 104-105 (42%) |
| Mammalia | 51 | 2 (4%) | 85 | 10 (12%) | 114 | 61 (54%) |
| | 326 | 18 (6%) | 557 | 137 (25%) | 620 | 310 (50%) |

## වගුව 2

### මිරිදිය අපෘෂ්ඨවංශී දේශීය විශේෂ හා සංඛ්‍යා - ප්‍රනාන්දු 1984

| කාණ්ඩය | විශේෂ ගණන | දේශීය විශේෂ ගණන / සටහන් |
|---|---|---|
| Monogenea | 23 (සමහර විට 23) | ඉන්දියානු ජීවීන්ට ඉතා සමීපයි. |
| Protozoa | 40 | විශේෂ සියල්ලම වාගේ අධ්‍යයනය කර ඇත. |
| Cladocera | 68 | විශේෂ සියල්ලම වාගේ අධ්‍යයනය කර ඇත. |
| Rotifera | 140 | - |
| Ostracoda | 31 | දේශීය 11. දුලබයි. සිටිනුයේ ස්ථාන කිහිපයක පමණි. |
| Aniostraca | 03 | පැතිරීම සීමිතයි. ඇතුළත්ය. |
| Conchostraca | 05 | - |
| Amphipoda | 02 | දැනුම අල්පයි. |
| Decapoda | 10 කූනිස්සෝ<br>11 මිරිදිය ඉස්සෝ හා පොකිරිස්සෝ , 7 කකුළුවෝ | 10 දේශීය: 5 කූනිස්සෝ, 1 පොකිරිස්සෝ, 4 කකුළුවෝ |
| Aquatic Mollusca | 31 | 12 දේශීය |
| Ephemeropetra | මුළු ගණන අඥාතයි. | මේ දක්වා දේශීය විශේෂ 18 |
| Simulidae (Diptera) | දේශීය 13 පමණ | |

## වගුව 3

### අපෘෂ්ඨවංශී දේශීය ගණ, විශේෂ හා උප විශේෂ සංඛ්‍යාව

| | ගණ | දේශීය ගණ | විශේෂ | දේශීය | උප විශේෂ |
|---|---|---|---|---|---|
| Pisces | 32 | 03 | 59 | 19 | 12 |
| Amphabia | 10 | 01 | 37 | 19 | 0 |
| Reptiles | 68 | 12 | 139 | 72 | 26 |
| Aves | 165 | 04 | 83 | 12 | 49 |

## වගුව 4

### ඇතැම් දුලබ ඔස්ට්‍රාකොඩ් සිටින ස්ථාන

| විශේෂය | ස්ථාන ගණන | ස්ථාන/ය |
|---|---|---|
| Ghardaglaia ambigua | 03 | රුහුණු ජාතික උද්‍යානයේ කලපු තුනක |
| Stenocypris fernadoi | 01 | පලටුපාන |
| Chrissia ceylonica | 02 | කලාවැව, පරාක්‍රම සමුද්‍රය |
| Chrissia halyi | 03 | පොළොන්නරුව, මහවිල්ල, කොළඹ |
| Centrocypris viridis | 03 | කලෙයිනගර්, කුල්ලන්ඩායි, මා-එළිය |
| Darwinula lundi | 01 | සබරගමුව (ගලන දියේ) |

## වගුව 5

### ඇතැම් පෘෂ්ඨවංශීන්ගේ සීමිත පැතුරුම

| | | |
|---|---|---|
| Mannophrys quentheri | පහත රට තෙත් කලාපය | 1 අඩ තැන්න |
| N. marmorata | තෙත් කලාපය | 11 අඩ තැන්න |
| N. ceyloneasis | තෙත් කලාපය | නකල්ස් පෙදෙස |
| Ceratophora aspera | පහත රට තෙත් කලාපය | සිංහරාජ පෙදෙස |
| C. tennanti | කඳු රට | මධ්‍යම පළාත |
| C. stoddardi | කඳු රට | නකල්ස් පෙදෙස |
| Illingworthi | මහ ඔය | |
| Cophotis ceylanica | මධ්‍යම කඳුකරය | |
| Calotes liolepis | 11 අඩතැන්න | |
| Myiophoneus blighi | හෝර්ටන් තැන්න | |

වගුව 6

**දේශීය පෘෂ්ඨවංශීන් පැතිර සිටින ප්‍රදේශ**

| | පහත රට තෙත් කලාප | කඳු රට | පහත රට වියළි කලාප | අන්තර් කලාප |
|---|---|---|---|---|
| මත්ස්‍යයෝ | 15 | 04 | 03 | 02 |
| උභයවාසී | 09 | 12 | 03 | – |
| උරග | 51 | 30 | 32 | 02 |
| පක්ෂී | 13 | 14 | 04 | 03 |
| ක්ෂීරපායි | 06 | 09 | 03 | 02 |

VIDUS 14-1-20

# ජාන සංරක්ෂණයේ නීතිමය පියවර

## සංරක්ෂණයට අදාල නීතිමය අංශය

### නීතියේ කාර්ය භාරය

ශාකවලට හා සත්වයන්ට ආරක්ෂාව සැලසීමේලා ලංකාව තුළ රාජ්‍ය ව්‍යවස්ථා මගින් වැදගත් සේවයක් ඉටු වී ඇත්තේය. 19 වැනි සියවසේ පසු භාගයේ පටන් එබඳු නීති රීති පනවා තිබේ. වර්තමාන නීතිමය රාමුවෙහි අරමුණු හා සීමාවන් අවබෝධ කර ගැනීම සඳහා මෙකී ව්‍යවස්ථා පිළිබඳව ලුහුඬු අධ්‍යයනයක් කිරීම ප්‍රයෝජනවත් වෙයි.

මෙම නීති රීති ජාතික හා ජාත්‍යන්තර වශයෙන් දෙකොටසකට බෙදා දැක්විය හැකිය. ඉක්බිති, ශීර්ෂ හයක් යටතේ ජාතික නීති රීති හඳුනාන්නට පුළුවන. ඒ මෙසේයි:

1. ශාක සංරක්ෂණය
2. සත්ව සංරක්ෂණය
3. වෙරළබඩ සත්ව සංරක්ෂණය
4. වගා බෝග ජාන සම්පත් සංරක්ෂණය
5. ජලජ ශාක හා සත්ව සංරක්ෂණය
6. තෙත් බිම් සංරක්ෂණය

1. **ශාක සංරක්ෂණය**

**වනාන්තර නීති**

1885 වනාන්තර පනත මෙරට පනවන ලද ආදිතම ව්‍යවස්ථාවලින් එකකි. එය කිහිප වරක් සංශෝධනය කර ඇත. ඉතාමත් මෑතදී එය සංශෝධනය කරන ලදුයේ 1988 දීය. වනාන්තර නීතියට අදල වූ මූලික පදනම ලෙස සැලකිය යුතු එමගින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන විවිධ වර්ගවල කැලෑ සහ වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවත්නා නොයෙක් අත්දමේ භූමි භාග සඳහා ඉඩකඩ සලස්වා ඇත. මෙකී කැලෑ සහ ඉඩම් මෙසේය:

(වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ)

1. ආරක්ෂිත වනාන්තර
2. යෝජිත ආරක්ෂිත වනාන්තර
3. ග්‍රාමීය වනාන්තර
4. සෙසු රාජ්‍ය වනාන්තර

(වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ)

1. දැඩි ආරක්ෂිත ස්වාභාවික කැලෑව
2. ජාතික වනෝද්‍යාන
3. ස්වාභාවික ආරක්ෂිත කලාප
4. වනාන්තර කපොලු

මෙකී භූමි භාග පවත්වා ගෙන යාම හා භාවිතය සහ ශාක හා සත්ව ජීවීන්ට සැලසෙන ආරක්ෂාවට අදල නීති රීති මෙම පනතෙහි අඩංගු වේ.

**1924 අංක 10 දරන ශාක ආරක්ෂක පනත**

මෙම පනත සම්මත කරන ලදුයේ ශ්‍රී ලංකාවේ ශාකවලට හානිදායක හෝ විනාශකාරී වූ වල් පැලෑටි, පළිබෝධ හා ලෙඩ රෝග පිටතින් පැමිණීම වළක්වනු සඳහාය. මෙම පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා වෙත පැවරී තිබේ.

**1928 අංක 31 දරන උද්භිද උද්‍යාන පනත**

කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට පැවරී තිබෙන උද්භිද උද්‍යානවලට අදල කළමනාකරණ, පරිපාලන හා පාලන කටයුතු සඳහා එමගින් විධිවිධාන සලස්වන ලදී.

**1951 අංක 9 දරණ දැව එළීමේ පනත**

නම් සඳහන් ගස් වර්ග කපා දැමීම නැවැත්වීම හෝ පාලනය කිරීම මෙම පනතේ අරමුණයි. (විශේෂයෙන්ම ඉවක් බවක් නැතිව කොස් ගස් කැපීම නැවැත්වීම).

1. **1980 අංක 47 දරන ජාතික පරිසර පනත (1989 අංක 56 දරන පනතින් සංශෝධිතයි)**

ජාතික පරිසර පනතට අනුව, වන සත්වයන් ආරක්‍ෂා කරමින්, ක්‍රමානුකූලව ඔවුන්ගෙන් ප්‍රයෝජන ලබා ගැනීමේ ක්‍රමය, ක්‍රමානුකූල වන සම්පත් උපයෝගිතාව, තර්ජනයට භාජනය වී ඇති වන සම්පත් අලෙවි කිරීම පාලනය, තර්ජනයට මුහුණ පා ඇති ශාක සම්පත් සංරක්‍ෂණය, යළි වන වගා ප්‍රයත්න ප්‍රවර්ධනය කිරීම, කාර්මික ගස් වගාව, වනෝද්‍යාන හා වන සත්ව කළමනාකරණය, බහු කාර්ය වනාන්තර, දැව කළමනාකරණය හා වන පර්යේෂණ ආදියට අදාළ උපක්‍රමයන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඇමතිවරයාට නිර්දේශ කරතැයි අපේක්‍ෂිතය. එහෙත්, මේ දක්වා මධ්‍යම පරිසර අධිකාරිය විසින් එබඳු ප්‍රතිපත්ති සකස් කර නැත. සංවර්ධන කටයුතුවලදී එමගින් සිදුවන පාරිසරික බලපෑම් අගැයීමක් කිරීමට ඉඩ සලසන ප්‍රථම පනත මෙය වේ. පරිසරයට හානි පැමිණීමට ප්‍රථම කුමන අන්දමේ ආරක්‍ෂක පියවර ගතයුතුදැයි තීරණය කිරීම සඳහා යොදා ගත හැකි හොඳම උපකරණය පාරිසරික බලපෑම් අගැයීමයි.

2. වෙරළබඩ සත්ව හා ශාක සංරක්‍ෂණය

1988 අංක 64 දරන පනතින් සංශෝධිත, 1971 අංක 57 දරන වෙරළ සංරක්‍ෂණ පනත මීට අදාල ප්‍රධාන ව්‍යවස්ථාව වේ.

මේ පනත අනුව, වෙරළ සංරක්‍ෂණ අධ්‍යක්‍ෂ විසින් වෙරළබඩ කලාපය පිළිබඳ සමීක්‍ෂණයක් පැවැත්වීම අවශ්‍ය කරන ලදී. වෙරළෙන් හිරිගල් ඉවත් කිරීම 1988 දී තහනම් කරන ලද අතර ක්‍රමානුකූල සම්පත් උපයෝගිතාවට අදාල සැලැස්මක් ද සකස් කරනු ලැබීය.

3. ජලජ ශාක හා සත්ව සංරක්‍ෂණය

1981 අංක 51 දරන ස්වාභාවික ජලජ සම්පත් හා සංවර්ධන අධිකාරි පනත. ජලජ සම්පත් පිළිබඳ ප්‍රධාන ආයතනය වූ ස්වාභාවික ජලජ සම්පත් හා සංවර්ධන අධිකාරිය මෙම පනත මගින් පිහිටුවනු ලැබීය.

**1940 අංක 24 දරන ධීවර ආඥා පනත**

ශ්‍රී ලංකාවේ ධීවර සම්පත් භාවිතය, පාලනය හා සංරක්‍ෂණය මෙම පනතින් පාලනය වේ.

සත්ව හා ශාක ආරක්ෂක පනත, CHANK ධීවර පනත (1953), තල්මස් ආඥා පනත (1936) හා මුතු බෙල්ලන් පිළිබඳ ආඥා පනත (1925) ආදිය සත්ව හා ශාක ජීවිතයට ආරක්ෂාව සලසන සෙසු අණ පනත් වේ.

4. වගා බෝග ජාන සම්පත් සංරක්‍ෂණය

ශ්‍රී ලංකාවේ ජාන සංරක්‍ෂණය සම්බන්ධයෙන් වැදගත් මෙහෙයක් ඉටු කරන ආයතන හා සේවා සැපයුම් ගොඩ නැගීමට දයක වූ ප්‍රධාන ආඥා පනත් තුනකි. ඒ මෙසේයි:

i 1972 අංක 5 දරන ගොවිජන සේවා පර්යේෂණ හා අභ්‍යාස ආයතන පනත
ii 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වතු සංස්ථා පනත
iii 1979 අංක 54 දරන ගොවිජන සේවා පනත

මීට අමතරව, වාණිජ වතු සංරක්‍ෂණ පාලනයට අදාල වූ හා පර්යේෂණ ආයතන ගොඩ නැගීමට සාධක වූ නීති රීති ද ඇත්තේය.

5. වගුරු බිම් සංරක්‍ෂණය

මෙය එතරම් අවධානයට යොමු නොවූ ක්ෂේත්‍රයකි. මෙම වගුරු බිම් ගැන සලකන ලදුයේ හිතුමනාපේ ගොඩකර හෝ අස්වද්ද භාවිතයට යෙදිය හැකි මුඩු බිම් ලෙසය.

එහෙත්, දැන් ඒවායේ වැදගත්කම වැටහී තිබෙන බැවින් ඒවායින් ඉටුවන මෙහෙය ක්‍රමානුකූලව අධ්‍යයනය කිරීමට පියවර ගෙන තිබේ.

**ජාත්‍යන්තර නීති රීති**

ජාන සම්පත් සහ ස්වාභාවික පරිසර පද්ධති සංරක්‍ෂණය උදෙසා ජාත්‍යන්තර මට්ටමින් ද පියවර ගත යුත්තේ ඒවායේ බලපෑම ජාතියකට අයත් භූමියට පමණක් සීමා නොවන බැවිනි.

එබැවින්, ජාත්‍යන්තර සම්මේලන ගණනාවක් මගින් මීට අදාල වැදගත් තීරණ රැගෙන ඇත. ඒවායින් කිහිපයක් මෙහිදී ලුහුඩින් සාකච්ඡා කෙරේ.

**රැම්සාර් ප්‍රඥප්තිය**

වගුරු බිම්වල වැදගත්කම පිළිගත් මෙම ප්‍රඥප්තිය මගින් ඒවායේ සංරක්ෂණයට අදාල තොරතුරු හුවමාරුවට හා පියවර ගැනීමට ඉඩ සලසා තිබේ. එහෙත්, ශ්‍රී ලංකාව මෙම ප්‍රඥප්තියේ අත්සන්කරුවකු නොවේ.

**1951 ශාක ආරක්ෂක ප්‍රඥප්තිය**

අත්සන්කරුවන් විසින් තිලමය ශාක ආරක්ෂක ආයතන පිහිටුවීමට හා ඒ අරමුණට අදල පියවර ගැනීමට ඉඩ සැලසේ. ශ්‍රී ලංකාව ද මෙහි අත්සන්කරුවන් 83 න් එක් අයෙකි.

**ජගත් සංස්කෘතික හා ස්වාභාවික දයාද සංරක්ෂණ ප්‍රඥප්තිය**

මෙම ප්‍රඥප්තිය පාර්ශ්වකරුවෝ පහත දක්වන කටයුතු ඉටු කිරීමට එකඟ වී සිටිති.

1. දයාදය ජන ජීවිතයේ සක්‍රීය අංශයක් බවට පත් කරවීමේ අරමුණු සහිත පොදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සහ එම දයාද සංරක්ෂණය කිරීමේ කටයුතු ක්‍රමානුකුල සැලසුම් වැඩ සටහන් තුළ අඩංගු කිරීම.

2. ආරක්ෂක හා සංරක්ෂක කටයුතු සඳහා උචිත කාර්ය මණ්ඩල සහිත සේවා ක්‍රම එකක් හෝ වැඩි ගණනක් පිහිටුවීම.

3. මෙම දයාදයන් හඳුනා ගැනීම, ඒවා ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, ඉදිරිපත් කිරීම හා පුනරුත්ථාපනය කිරීම සඳහා උචිත පරිදි අදල නීතිමය, විද්‍යාත්මක, තාක්ෂණික, පරිපාලන හා මූල්‍යමය පියවර ගැනීම.

4. **ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුවා මේ ක්ෂේත්‍රයට අදල විද්‍යාත්මක පර්යේෂණවලට අනුබලදීම**

**මෙකී සංස්කෘතික හා ස්වාභාවික දයාද ජගත් දයාද බව පිළිගන්නා (ප්‍රඥප්තියේ) පාර්ශ්ව කරුවෝ සමස්තයක් වශයෙන් ඒවා ආරක්ෂා කිරීම ජාත්‍යන්තර ප්‍රජාවගේ වගකීම බව පිළිගනිති. මේ ප්‍රඥප්තියේ අත්සන්කරුවන් වන අන් රාජ්‍යවල පිහිටි එබඳු දයාදයන්ට කෙලින්ම හෝ අතියම් අයුරින් හෝ හානිදයක විය හැකි කිසිදු පියවරක් නොගැනීමට ද ඔවුහු ප්‍රතිඥ දෙති.**

ජගත් දයාදයට අයත් ස්වාභාවික භූමි ප්‍රදේශ තෙවර්ගයකි. විශාල ක්ෂීරපායි සත්ව සමූහයන්ගේ වාස භූමි ඉන් පළමුවැන්නයි. වගුරු බිම් දෙවැන්නට වැටේ. ජීව විද්‍යාත්මක ආරක්ෂිත කලාප තෙවැනි වර්ගයට ඇතුළත් වෙයි. අනුරාධපුර පූජා නගරය, පැරණි පොළොන්නරුව, පැරණි සීගිරිය හා සිංහරාජ අඩවිය ශ්‍රී ලංකාව විසින් ජගත් දායාදවලට ඇතුළත් කර ඇත. මේ තුනෙන් ස්වාභාවික දයාද තුළට අයත් වනුයේ තෙවැන්න පමණකි. රටවල් 85 ක් විසින් මෙම ප්‍රඥප්තියට අත්සන් තබා ඇත. ශ්‍රී ලංකාව තුළ පවත්නා එබඳු ප්‍රදේශවල ආරක්ෂාව පිණිස ශ්‍රී ලංකාවේ ජාතික දායාද වනගත ප්‍රදේශ පනත සම්මත කරනු ලැබීය.

**බොන් ප්‍රඥප්තිය**

ජාතික දේශසීමා හෝ බලසීමා හරහා හෝ ඉන් බැහැර පෙදෙස් හරහා සංක්‍රමණය වන, වන සතුන් ආරක්ෂා කිරීමේ ප්‍රධාන අරමුණින් යුතුව (1979) බොන් නුවරදී මෙම ප්‍රඥප්තිය සකස් කරනු ලැබීය. මේ දක්වා රටවල් 40 ක් පමණ එයට අත්සන් තබා / අනුමත කර / එකඟ වී ඇත. මෙකී ප්‍රඥප්තිය තුළ ගැප් ප්‍රතිපත්ති මොනවාද, එය සැකසීමට හේතු මොනවාද යනු ප්‍රඥප්තියේ පූර්විකාවෙහි මෙසේ සඳහන් කර ඇත.

1. විවිධ ස්වරූප දරන වනගත සත්වයෝ මහ පොළොවේ ස්වභාවික පද්ධතියෙහි අනිවාර්ය කොටසක් වෙති. මිනිසාගේම යහපත උදෙසා ඔවුන් සංරක්ෂණය කළ යුතු වෙයි.

2. පාරිසරික, ජානමය, විද්‍යාත්මක, සෞන්දර්යමය, විනෝදාත්මක, සංස්කෘතික, අධ්‍යාපනික,

සමාජයීය, හා ආර්ථික අතින් වනගත සත්වයෝ අතිවිශාල අගයක් ඇත්තාහු වෙත්.

3. සිය ජාතික දේශ සීමා තුළ ජීවත් වන හෝ ඒ හරහා ගමන් කරන සංක්‍රමණශීලි වන සතුන්ගේ ආරක්ෂකයා වනුයේ - විය යුත්තේ - අදාල රාජ්‍යයයි.

4. සංක්‍රමණශීලි සත්ව විශේෂ සංරක්ෂණය කිරීමට හා ඵලදායි අයුරින් ඔවුන් පිළිබඳ කළමනාකරණය සඳහා එම සතුන් සිය ජීවන චක්‍රයෙහි කිසියම් කොටසක් හෝ ගත කරන ප්‍රදේශයක් සිය දේශ සීමාවට ඇතුළත් වන සියලුම රාජ්‍යයන්ගේ ඒකාබද්ධ ක්‍රියාකාරීත්වය අවශ්‍ය කෙරේ.

සංක්‍රමණශීලි සත්ව විශේෂවලට හානිකර විය හැකි කිසිදු පියවරකින් වැළකී සිටීම හා එබඳු විශේෂවලට අදාල පර්යේෂණ කටයුතු සඳහා අනුබල දීම අවශ්‍ය බව ප්‍රඥප්තියේ අත්සන්කරුවෝ පිළිගතිති. කාලානුරූපව, කලින්ම නිගමනය කළ හැකි නිශ්චිත පිළිවෙලකට අනුව, එක් ජාතියක හෝ ජාතීන් ගණනාවක දේශ සීමා හරහා විශාල වශයෙන් ගමන් කරන මුළු සත්ව විශේෂ ප්‍රජාවක් හෝ එබඳු ප්‍රජාවකට අයත්, භූගෝලීය වශයෙන් ප්‍රජාවේ අන් සාමාජිකයන්ගෙන් වෙන්ව සිටින සත්ව විශේෂ සමූහයක් හෝ වනගත සතුන්ගේ පහළ තක්සෝන හෝ සංක්‍රමණශීලී විශේෂ ලෙස අර්ථ නිරූපණය කර ඇත.

ශ්‍රී ලංකාව මෙම ප්‍රඥප්තියට අත්සන් තබා ඇතත් තවම එය අනුමැතියට භාජනය කළ යුතුව ඇත. වල් තාරාවන් (සේරුන්) වැනි සංක්‍රමණ පක්ෂීහු තවමත් ශ්‍රී ලංකාව තුළ දඩයම් කරනු ලැබෙත්. ඉතා ඉක්මනින් ශ්‍රී ලංකාව විසින් මෙම ප්‍රඥප්තිය අනුමත කොට එය ක්‍රියාත්මක කිරීම වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරිය යුතුව ඇත.

### 1973 සයිටිස් ප්‍රඥප්තිය

"අලංකාර සහ විවිධාකාර ස්වරූප නිසා පෘථිවි ගෝලයෙහි ස්වාභාවික පද්ධතීන්ගේ අත්‍යවශ්‍ය හා යළි සැපයිය නොහැකි කොටසක් වූ ද වර්තමාන හා අනාගත පරපුර සඳහා ආරක්ෂා කර තැබිය යුතු වූ ද" වල් සත්ව හා ශාක විශේෂවල ආරක්ෂාව සඳහා ජාත්‍යන්තර මට්ටමේ පාලන උපක්‍රම යෙදීම මෙම ප්‍රඥප්තියේ අරමුණ වේ.

මේ දක්වා රටවල් 90 කට වැඩි ගණනක් ඊට අත්සන් තබා ඇති අතර, ශ්‍රී ලංකාව ද ඊට අයත් වෙයි. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වේ. වඳ වී යාමේ අනතුරට මුහුණ පා සිටින සත්ව විශේෂ අපනයනය සොයා ගැනීමට හරස් වන එක් බාධකයක් නම්, එබඳු සත්ව විශේෂ හඳුනා ගැනීම සඳහා පුහුණුව ලත් නිලධාරීන් රේගු දෙපාර්තමේන්තුව තුළ හිඟ වීමයි. ශ්‍රී ලංකාවෙන් මේවර ඉබ්බන් රට යැවුණු එක් අවස්ථාවක් මෑතදී වාර්තා විය.

### ජීව විද්‍යාත්මක විවිධත්වය සංරක්ෂණ උදෙසා වූ පනත් කෙටුම් පත

ජීව විද්‍යාත්මක විවිධත්වය සුරැකීම සඳහා එක්සත් ජාතීන් විසින් යෝජිත ගිවිසුමට ඇතුළත් කරනු පිණිස IUCN (ස්වභාවික සම්පත් සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය) විසින් සකසන ලද ව්‍යවස්ථා කෙටුම් පත් ගැන ද මෙහිදී සඳහන් කළ යුතුව තිබේ. මේ කටයුත්තට අදලව රාජ්‍යයන් සතු පොදු වගකීම, ජීව විද්‍යාත්මක විවිධත්වය හා සංරක්ෂණ ප්‍රදේශ ලැයිස්තුවක් සකස් කිරීම ආදිය ඊට අයත් වෙයි. ජීව විද්‍යාත්මක විවිධත්ව සංරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය දිය යුතු ලෝක ව්‍යාප්ත ප්‍රදේශ ලැයිස්තුවක් ද සකස් කිරීමට යෝජිතය. ජීව විද්‍යාත්මක විවිධත්වයට තදින් හානි සිදුවිය හැකි ඕනෑම කටයුත්තක් සම්බන්ධයෙන් EIA පිළියෙල කිරීම ඒ අතරින් ඉතාමත් වැදගත් ස්ථානය උසුලයි.

### සමාප්තිය හා නිර්දේශ

මෑතදී සකස් කරන ලද පනත් හැර, ශාක සත්ව විශේෂ සංරක්ෂණයට අදල වූ බොහොමයක් අණ පනත් යල් පැන ගොස් ඇත. එබැවින්, ඒවා සංශෝධනය කළ යුතු වේ. වනාන්තර ආඥා පනත, තල්මස් ආඥා පනත, ධීවර ආඥා පනත - මෙසේ සංශෝධනය විය යුතු පනත් කිහිපයකි. ඕනෑම සංරක්ෂණ නීතියක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මහජන සහයෝගය අත්‍යවශ්‍ය වන බැවින්, ජනතා සහභාගිත්වය වැඩියෙන් ලැබෙන අයුරින් එම පනත් යළි සැකසිය යුතු වේ.

සංරක්ෂණ කටයුතු සඳහා ජනතාව සහභාගි කර ගැනීමට නම් සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ මනා අවබෝධයක් ඔවුන් සතු විය යුතු බව ද ඉන් අදහස් කෙරේ. මේ පිණිස ජනතා අධ්‍යාපනය හා අවබෝධය වගා දිගා කරලීම ඉතා වැදගත් වේ. එබැවින්, මේ අංශය කෙරේ විශේෂ අවධානය යොමු විය යුතුය.

වගුරු බිම් ආරක්ෂාව සඳහා අණ පනත් සකස කළ යුතු අතර ඉතා ඉක්මනින් ශ්‍රී ලංකාව වගුරු බිම් පිළිබඳ රැස්මාර් ප්‍රඥප්තියට අත්සන් තැබිය යුතුය සංක්‍රමණ සත්ව විශේෂ පිළිබඳ බොන් ප්‍රඥප්තිය ද ශ්‍රී ලංකාව විසින් අනුමත කර එය ක්‍රියාත්මක කිරීමේ වගකීම වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරිය යුතුව ඇත.